සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**තෙවන වාර පරීක්ෂණය**
**மூன்றாம் தவணைப் பரீட்சை - 2026**
**Third Term Test**

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | ගිණුම්කරණය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

- ❖ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ❖ සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ.
- ❖ විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ❖ වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

**විභාග අංකය: ..........................................................**

| 1 පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 1 – 30 | |
| 31 - 50 | |
| **එකතුව** | |

(1) පහත ප්‍රකාශන අතරින් මූල්‍ය ගිණුම්කරණයේ කාර්යභාරය වඩාත් පුළුල්ව විස්තර කරනු ලබන ප්‍රකාශනය වන්නේ කවරක්ද?
1. ඒකකයක ප්‍රාථමික ඇල්මැති පාර්ශවයන්ට අතීත හා අනාගත මූල්‍ය තොරතුරු සන්නිවේදනය කිරීමයි.
2. ඒකකයක බාහිර පාර්ශවයන්ගේ ආර්ථික තීරණ ගැනීම සඳහා ඓතිහාසික මූල්‍යමය තොරතුරු සම්පාදනය කිරීමයි.
3. ඒකකයක අභ්‍යන්තර පාර්ශවයන්ගේ අනාගත ආර්ථික තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන පුරෝකථන තොරතුරු සම්පාදනය කිරීමයි.
4. පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත කිරීම සඳහා මූල්‍යමය හා මූල්‍යමය නොවන තොරතුරු සම්පාදනය කිරීමයි.
5. ඒකකයක සියලුම ඇල්මැති පාර්ශවයන්ගේ මූල්‍ය අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා තීරණ ගැනීමට අදාළ වන තොරතුරු සැපයීමයි. (..............)

(2) ආයතනයක දේපළ පිරියත හා උපකරණ තුළ ඇතුළත් ක්ෂය කළ හැකි වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ, ඒවායේ ධාරණ අගය මත හඳුනා ගැනීම කුමන ගිණුම්කරණ සංකල්පය මත පදනම් වේද?
1. මූල්‍ය මිනුම් 2. ප්‍රමාණාත්මක බව 3. ආරක්ෂණ
4. කාලච්ඡේද 5. අඛණ්ඩ පැවැත්ම (..............)

(3) පහත සඳහන් ගිණුම්කරණ පිළිවෙත් අතරින් උපලබ්ධි සංකල්පයට සෘජුවම අදාළ වන ගිණුම්කරණ පිළිවෙත වන්නේ,
1. ණයට විකුණුම් මත ඇති වූ හානිකරණ අලාභයක් අදාළ කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනා ගැනීම.
2. වෙළඳ ලැබිය යුතු දෑ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ එහි ධාරණ අගය මත හඳුනා ගැනීම.
3. ආයෝජන ආදායම් සිල්ලර වෙළඳ ව්‍යාපාරයක වෙනත් ආදායම් යටතේ හඳුනා ගැනීම.
4. විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත ගනුදෙනුකරුවෙකු වෙත යැවූ තොග ඒවා යැවූ අවස්ථාවේදී ණය විකුණුම් ලෙස හඳුනා නොගැනීම.
5. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ සියලු ආදායම් මුදල් පදනමට හඳුනා ගැනීම. (..............)

- **අංක (4), (5), (6) සහ (7) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගී කරගන්න.**

එකතු කළ අගය මත බදු (VAT) අයකිරීම සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක 2026 මාර්තු මස තුළ පහත ගනුදෙනු සිදු වී ඇත.
03/01 අයිතිකරු අතිරේක ප්‍රාග්ධනය ලෙස රු. 500,000 මුදලක් ව්‍යාපාරයට යෙදවීම.
03/06 පිරිවැය රු. 240,000 ක් තොගයක් රු. 354,000 (18% ක VAT ඇතුළත්) කට රවිඳුට ණයට විකිණීම.
03/10 පිරිවැය මත $33\frac{1}{3}\%$ ක ලාභයක් ලැබෙන පරිදි රු. 236,000 (18% ක VAT ඇතුළත්) කට භාණ්ඩ තොගයක් අත්පිට විකිණීම.
03/12 රවිඳුට 3/6 දින විකුණූ තොගයෙන් $\frac{1}{4}$ ක් ඔහු විසින් ආපසු හරවා එවීම.
03/20 රු. 15,500 ක මුදල් වට්ටමක් අඩු කර රවිඳුගෙන් ලැබිය යුතු මුළු මුදල ලැබීම.

(4) 3/1, 3/6, 3/12 සහ 3/20 දිනවල සිදුවූ ගනුදෙනු ව්‍යාපාරයේ පොත්වල වාර්තා කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
1. ජ'නල් වවුචරය, ඉන්වොයිසිය, බැරපත, ලදුපත 2. ලදුපත, ඉන්වොයිසිය, හරපත, ලදුපත
3. ලදුපත, ඉන්වොයිසිය, බැරපත, ලදුපත 4. ජ'නල් වවුචරය, ඉන්වොයිසිය, හරපත, ලදුපත
5. ලදුපත, ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය (..............)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(5) 3/12 සිදු වූ ගනුදෙනුව පොදු ලෙජරයට පිටපත් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

| | | | රු. | රු. |
|---|---|---|---|---|
| 1. | ණයගැති පාලන ගිණුම | - හර | 88,500 | |
| | ආපසු එවුම් ගිණුම | - බැර | | 75,000 |
| | VAT පාලන ගිණුම | - බැර | | 13,500 |
| 2. | ණයගැති පාලන ගිණුම | - හර | 70,800 | |
| | ආපසු එවුම් ගිණුම | - බැර | | 60,000 |
| | VAT පාලන ගිණුම | - බැර | | 10,800 |
| 3. | ආපසු එවුම් | - හර | 88,500 | |
| | VAT පාලන ගිණුම | - බැර | | 13,500 |
| | ණයගැති පාලන ගිණුම | - බැර | | 75,000 |
| 4. | ආපසු එවුම් ගිණුම | - හර | 60,000 | |
| | VAT පාලන ගිණුම | - හර | 10,800 | |
| | ණයගැති පාලන ගිණුම | - බැර | | 70,800 |
| 5. | ආපසු එවුම් ගිණුම | - හර | 75,000 | |
| | VAT පාලන ගිණුම | - හර | 13,500 | |
| | ණයගැති පාලන ගිණුම | - බැර | | 88,500 |

(..............)

(6) ඉහත සියලු ගනුදෙනු අවසානයේදී ගිණුම්කරණ සමීකරණයට ඇති වූ ශුද්ධ බලපෑම නිවැරදිව දැක්වෙන පිළිතුර මින් කවරක්ද?

| | වත්කම් (රු'000) | = | වගකීම (රු'000) | + | හිමිකම (රු'000) |
|---|---|---|---|---|---|
| 1. | 656 | = | 76.5 | | 579.5 |
| 2. | 642.5 | = | 63 | | 579.5 |
| 3. | 156 | = | 76.5 | | 79.5 |
| 4. | 596 | = | 76.5 | | 519.5 |
| 5. | 656 | = | 63 | | 593 |

(..............)

(7) ඉහත සියලු ගනුදෙනු සැලකිල්ලට ගත් විට 2026 මාර්තු මාසයට අදාළ මුළු වියදම සහ මාර්තු මාසය තුළ මුදල් ශේෂයේ ශුද්ධ වැඩි වීම / අඩු වීම කොපමණද?

| | මුළු වියදම (රු'000) | මුදල් ශේෂය (රු'000) |
|---|---|---|
| 1. | 390 | වැඩි වීම 986 |
| 2. | 390 | වැඩි වීම 1001.5 |
| 3. | 345.5 | වැඩි වීම 845.5 |
| 4. | 345.5 | වැඩි වීම 986 |
| 5. | 405.5 | වැඩි වීම 1001.5 |

(..............)

(8) 2026 ජනවාරි 31 දින සපුමල්ගේ ව්‍යාපාරයට ලද බැංකු ප්‍රකාශනය අනුව පැවති බැර ශේෂය රු. 186,000 කි. එදිනට ව්‍යාපාරයේ මුදල් ගිණුම අනුව හර ශේෂය රු. 185,000 ක් විය.

- 2026 ජනවාරි 01 දිනට මුදල් ගිණුමේ ශේෂය එදින බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා රු. 65,000 ක් වැඩියෙන් දැක්වුණු අතර, 2025 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් කිසිවක් නොවීය.
- 2026 ජනවාරි මස බැංකු ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටාගෙන ඇත. මේවා මුදල් ගිණුමට ගළපා නැත.
  - සෘජු ප්‍රේෂණ රු. 60,000 - ස්ථාවර නියෝග මත ගෙවීම් රු. 23,000
  - බැංකු ගාස්තු රු. 2,000
- 2026 ජනවාරි මාසය තුළ තැන්පත් කළ චෙක්පත් රු. 240,000 කි.
- ජනවාරි මස බැංකු ප්‍රකාශනය අනුව සෘජු ප්‍රේෂණ හැර තැන්පතු වටිනාකම රු. 100,000 කි.

2026 ජනවාරි 31 දිනට සංශෝධිත මුදල් ගිණුමේ ශේෂය සහ එදිනට ගෙවීමට ඉදිරිපත් වී නැති චෙක්පත්වල වටිනාකම වන්නේ,

| | සංශෝධිත මුදල් ගිණුමේ ශේෂය (රු'000) | ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් (රු'000) |
|---|---|---|
| 1. | 221,000 | 171,000 |
| 2. | 220,000 | 171,000 |
| 3. | 220,000 | 205,000 |
| 4. | 220,000 | 106,000 |
| 5. | 220,000 | 31,000 |

(..............)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

- **අංක (9) සහ (10) ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාළ කරගන්න.**

සඳුන් එන්ටර්ප්‍රයිසස් හි 2026.03.31 දිනෙන් අවසන් අර්ධ වර්ෂය සඳහා කෙටුම්පත් ශුද්ධ ලාභය රු. 373,000 කි. නමුත් එම කාලපරිච්ඡේදය තුළ ගනුදෙනු ගිණුම්ගත කිරීමේදී සහ අවසාන ගිණුම් පිළියෙළ කිරීමේදී පහත දෝෂ පැවති බව පසුව අනාවරණය විය.

A - 2025 දෙසැම්බර් මාසයේ ආපසු යැවුම් ජ'නලයේ එකතුව රු. 10,000 ක් වැඩියෙන් ගණනය කර ඇත.

B - මුදලින් ලද කොමිස් ආදායම් රු. 16,000 ක් ලෙජරයට පිටපත් කිරීමේදී කොමිස් ආදායම් ගිණුමට දෙවරක් පිටපත් කර ඇත.

C - 2026.01.31 දින රු. 5,000 ක පොලිය ඇතුළත් බැංකු ණය වාරිකය වු රු. 25,000 ක් මුදලින් ගෙවා ඇතත් එය බැංකු ණය ගිණුමට පිටපත් කර නැත. අනෙක් සටහන් නිවැරදිව තබා ඇත.

D - 2026 මාර්තු මාසය සඳහා රු. 7,200 ක විදුලි ගාස්තු මාර්තු 31 දිනට ගෙවා නොමැති අතර එය විදුලි ගාස්තු ගිණුමට හර කොට වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුමට බැර කර ඇත.

E - දේපළ පිරියත උපකරණ වාර්ෂික ක්ෂය රු. 60,000ක් සහ මාසික කඩකුලී ආදායම් රු. 6,000 ක් ලාභය ගණනය කිරීමේදී ගැලපුම් කර නැත. (කාලච්ඡේදයට අදාළව කඩකුලී ආදායම් කිසිවක් මුදලින් ලැබී නැත.)

(9) ඉහත දෝෂ නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ පැවති ශේෂය සහ නිවැරදි කිරීම් නිසා ව්‍යාපාරයේ වගකීම්වලට ඇති වු ශුද්ධ බලපෑම දැක්වෙන පිළිතුර වන්නේ,

| | **අවිනිශ්චිත ගිණුමේ ශේෂය** | **වගකීම්වලට ඇති වු ශුද්ධ බලපෑම** |
|---|---|---|
| 1. | රු. 25,000 (හර) | රු. 15,000 කින් අඩු වේ. |
| 2. | රු. 36,000 (හර) | රු. 10,000 කින් අඩු වේ. |
| 3. | රු. 41,000 (හර) | රු. 15,000 කින් අඩු වේ. |
| 4. | රු. 36,000 (බැර) | රු. 7,800 කින් අඩු වේ. |
| 5. | රු. 41,000 (බැර) | රු. 10,000 කින් අඩු වේ. |

(..............)

(10) 2026.03.31 දිනෙන් අවසන් අර්ධ වර්ෂය සඳහා නිවැරදි ශුද්ධ ලාභය වන්නේ,

1. රු. 348,000 කි. 2. රු. 353,000 කි. 3. රු. 345,800 කි. 4. රු. 340,800 කි. 5. රු. 359,000 කි.

(..............)

(11) තනි පුද්ගල ව්‍යාපාරයක් වූ අශේනිගේ ව්‍යාපාරයේ 2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු'000 |
|---|---|
| මුළු ගැනුම් | 2,400 |
| විකුණුම් | 5,200 |
| කාලච්ඡේදය තුළ, | |
| - තොග අඩුවීම | 200 |
| - වෙළඳ ගෙවිය යුතු දෑ අඩු වීම | 200 |
| - වෙළඳ ලැබිය යුතු දෑ වැඩි වීම | 300 |

අනෙකුත් තොරතුරු,

- සියලු විකුණුම් ණයට සිදු වු අතර වර්ෂය තුළ අත්පිට ගැනුම් රු. 400,000 කි.

2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් පදනමට සහ උපචිත පදනමට ව්‍යාපාරයේ දළ ලාභය වන්නේ,

| | **මුදල් පදනමට (රු'000)** | **උපචිත පදනමට (රු'000)** |
|---|---|---|
| 1. | 2,400 | 2,600 |
| 2. | 2,700 | 2,600 |
| 3. | 2,900 | 2,800 |
| 4. | 2,700 | 2,800 |
| 5. | 2,300 | 2,600 |

(..............)

(12) ව්‍යාපාර ආයතනයක ලෙජරය පවත්වාගෙන යාමට අදාළව පහත ප්‍රකාශන අතරින් නිවැරදි ප්‍රකාශනය වන්නේ මින් කවරක්ද?

1. උපලෙජර සහිතව ලෙජරය පවත්වාගෙන යාමේදී පොදු ලෙජරය තුළ තනි සටහන් ක්‍රමයට ගිණුම් පවත්වා ගනී.
2. පොදු ලෙජරය තුළ පාලන ගිණුම් පවත්වා ගන්නා බැවින් ණයගැති / ණයහිමි පෞද්ගලික ගිණුම් කිසිදු ලෙජරයක පවත්වා ගත යුතු නොවේ.
3. උපලෙජරයන්හි ශේෂ ලැයිස්තුවල එකතුව කාලච්ඡේදයක් අවසානයේදී පොදු ලෙජරයේ පාලන ගිණුම්වලට මාරු කෙරේ.
4. පොදු ලෙජරයේ සංශෝධිත පාලන ගිණුම්වල ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ නිරූපණය කෙරේ.
5. උප ලෙජර ශේෂ ලැයිස්තුවල එකතුව සෑම විටම නිවැරදි ශේෂය ලෙස සැලකිය හැකි වේ.

(..............)

- **අංක (13) සහ (14) ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාළ කරගන්න.**

''සියත'' ප්‍රඩක්ට්ස් ආයතනයේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කරන ලද පිරිවැය තොරතුරු කිහිපයක් පහත වේ. ආයතනය 2025.04.01 දින ආරම්භ කරන ලදී.

| | |
|---|---|
| ඒකකයක නිෂ්පාදන පිරිවැය | රු. 108 |
| 2026.03.31 දිනට නිමි තොගය (පිරිවැය) | රු. 172,800 |
| විකුණුම් පිරිවැය | රු. 691,200 |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

අතිරේක තොරතුරු,

1. ආයතනයේ නිෂ්පාදන යන්ත්‍ර පිරිවැය රු. 1,400,000 ක් වන අතර පිරිවැය මත 10% ක් යන්ත්‍ර ක්ෂය කළ යුතු වුවත් නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී එය මඟ හැරී ඇත.
2. නිෂ්පාදන සේවක වැටුප්වලට අදාළ සේවක අර්ථ සාධක අරමුදල් EPF සේවා යෝජක දායකය වූ රු. 36,000 ක් පිළිබඳව ගැලපීමක් කර නොමැත.
3. වර්ෂය තුළ නිපද වූ ඒකක වලින් 20% ක් 2026.03.31 දිනට ඉතිරිව තිබුණි.

(13) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී නිපද වූ ඒකක සංඛ්‍යාව සහ සියලු පිරිවැය සැලකිල්ලට ගත් පසු ඒකකයක නිෂ්පාදන පිරිවැය වන්නේ,

| | **නිපද වූ ඒකක ගණන** | **ඒකකයක නිෂ්පාදන පිරිවැය** |
|---|---|---|
| 1. | 8,000 | රු. 125.50 |
| 2. | 1,600 | රු. 122.00 |
| 3. | 8,000 | රු. 130.00 |
| 4. | 8,000 | රු. 112.50 |
| 5. | 6,400 | රු. 130.00 |

(..............)

(14) 2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා නිවැරදි විකුණුම් පිරිවැය වන්නේ,

1. රු. 1,040,000 කි. 2. රු. 900,000 කි. 3. රු. 832,000 කි.
4. රු. 867,600 කි. 5. රු. 831,200 කි. (..............)

(15) "ජයනියත" ක්‍රීඩා සමාජයේ සාමාජික මුදල්වලට අදාළව පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | **2026.03.31 රු'000** | **2025.03.31 රු'000** |
|---|---|---|
| හිඟ සාමාජික මුදල් | 18 | 25 |
| කලින් ලද සාමාජික මුදල් | ? | 32 |
| යාවජීව සාමාජික මුදල් | 162 | 202 |

- 2025/2026 වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල්
  - 2024/2025 වර්ෂය සඳහා රු. 18,000
  - 2025/2026 වර්ෂය සඳහා රු. 122,000
  - 2026/2027 වර්ෂය සඳහා රු. 10,000

- 2024/2025 වර්ෂය සඳහා 2026.03.31 දිනට හිඟ සාමාජික මුදල් කපා හැරීමට තීරණය කර ඇත.
- ඉහත දක්වා ඇති 2026.03.31 දිනට හිඟ හිටි සාමාජික මුදල් තුළ 2024/2025 වර්ෂයට හිඟ සාමාජික මුදල් ඇතුළත් නොවේ. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු මුළු සාමාජික මුදල් ආදායම,

1. රු. 212,000 කි. 2. රු. 172,000 කි. 3. රු. 165,000 කි.
4. රු. 205,000 කි. 5. රු. 179,000 කි. (..............)

- **ප්‍රශ්න අංක (16) සහ (17) සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගී කරගන්න.**

දිනිති, අනුත්තරා සහ ප්‍රාර්ථනා පිළිවෙළින් 2 : 2 : 1 අනුපාතයට ලාභාලාභ බෙදාගන්නා, වෙළඳ ව්‍යාපාරයක හවුල්කරුවන් වේ. වර්ෂයේ ආරම්භක ශේෂයට 10% ක ප්‍රාග්ධන පොලියක් හවුල්කරුවන්ට හිමි වේ. 2025/2026 වර්ෂයට අදාළව හවුල්කරුවන්ගේ හිමිකමට අදාළ තොරතුරු කිහිපයක් පහත වේ.

| හවුල්කරු | 2025.04.01 ජංගම ගිණුම් ශේෂ | 2026.03.31 ප්‍රාග්ධන ගිණුම් ශේෂ | 2025/2026 වර්ෂය සඳහා | | |
|---|---|---|---|---|---|
| | | | ප්‍රාග්ධන පොලී | ලාභ කොටස | ගැනිලි |
| දිනිති | 800 (බැර) | 3,425 | 350 | 220 | 170 |
| අනුත්තරා | 700 (බැර) | 3,425 | 350 | 220 | 70 |
| ප්‍රාර්ථනා | 750 (බැර) | 2,650 | 250 | 110 | 110 |

- 2026.03.31 දින ප්‍රාර්ථනා ව්‍යාපාරයෙන් විශ්‍රාම යාමට තීරණය කළ අතර, එදිනට කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුමෙන් ගැලපීම් කළ පසු ප්‍රාග්ධන ගිණුමේ ශේෂය ඉහතින් දක්වා ඇත. විශ්‍රාම යාමට අදාළ වෙනත් කිසිදු ගැලපීමක් සිදු කර නැත.
- 2026.03.31 දිනට පිරිවැය රු. 2,000,000 ක් හා සමුච්චිත ක්ෂය රු. 350,000 ක් වූ මෝටර් රථයක් එහි ධාරණ අගයට ප්‍රාර්ථනාට පවරා දී ඇගේ හිමිකම ණයට ගිණුමකට මාරු කිරීමට හවුල්කරුවන් එකඟ විය.
- දිනිති සහ අනුත්තරා සමාන හවුල්කරුවන් ලෙස ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගැනීමට ද එකඟ විය.

(16) හවුල් වනපාරයේ 2025.04.01 දිනට සහ ප්‍රාර්ථනා විශ්‍රාම යාමට අදාළ කිසිදු ගැලපීමක් සිදු කිරීමට පෙර 2026.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම,

| | 2025.04.01 දිනට රු'000 | 2026.03.31 දිනට රු'000 |
|---|---|---|
| 1. | 11,750 | 12,550 |
| 2. | 11,750 | 12,400 |
| 3. | 12,550 | 11,450 |
| 4. | 11,750 | 12,900 |
| 5. | 12,400 | 11,750 |

(..............)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(17) ප්‍රාර්ථනා විශ්‍රාම ගත් දිනට ව්‍යාපාරයේ මුළු කීර්තිනාම වටිනාකම සහ 2026.04.01 දිනට ප්‍රාර්ථනාගේ ණය ගිණුම් ශේෂය,

| | **මුළු කීර්ති නාමය රු'000** | **ණය ගිණුමේ ශේෂය රු'000** |
|---|---|---|
| 1. | 375 | 2,000 |
| 2. | 750 | 3,650 |
| 3. | 375 | 3,650 |
| 4. | 750 | 2,650 |
| 5. | 750 | 2,000 |

(..............)

- **අංක (18) සහ (19) ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු අදාළ කරගන්න.**

සීමිත නිශ්ශංක පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම රු. 2,900,000 කි. මුළු විස්තීර්ණ ආදායම ගණනය කිරීමේදී සැලකිල්ලට ගත් තොරතුරු කිහිපයක් පහත වේ.

| | **රු'000** |
|---|---|
| අයභාර - විකුණුම් | 11,000 |
| - සේවා සැපයීම් | 1,400 |
| වෙනත් ආදායම් | 1,000 |
| මෙහෙයුම් වියදම් | 2,800 |
| ආදායම් බදු වියදම | 700 |

අතිරේක තොරතුරු,

(i) 2025/2026 වර්ෂයේ දළ ලාභය රු. 4,000,000 කි. වෙනත් ආදායම් ලෙස හඳුනාගෙන ඇත්තේ සමාගමේ මෝටර් රථ 2026.03.31 දින ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනයෙන් හඳුනාගත් අතිරික්තයයි.

(ii) 2025.04.01 දින ව්‍යාපාරයේ ගොඩනැගිලි ද දෙවන වරට ප්‍රත්‍යාගණනය කර ඇති අතර, එහිදි හඳුනාගත් අතිරික්තය රු. 1,800,000 කි. (2024.04.01 ප්‍රථම ප්‍රත්‍යාගණනයේදී හඳුනාගත් අතිරික්තය රු. 1,500,000 කි.)

(iii) 2024.04.01 දින ව්‍යාපාරයේ ඉඩම් ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනයෙන් රු. 600,000 ක අතිරික්තයක් වාර්තා වී තිබූ අතර, 2025.04.01 දින දෙවන වර ප්‍රත්‍යාගණනයේදී ඌනතාවයක් හඳුනාගෙන ඇත.

(18) 2025.04.01 දින ඉඩම් දෙවන වර ප්‍රත්‍යාගණනයෙන් හඳුනාගත් ප්‍රත්‍යාගණන ඌනතාවය කොපමණද?

1. රු. 2,400,000 කි.
2. රු. 400,000 කි.
3. රු. 1,400,000
4. රු. 1,800,000
5. රු. 600,000 කි.

(..............)

(19) 2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා මුළු ආදායම හා මුළු වියදම වන්නේ,

| | **මුළු ආදායම රු'000** | **මුළු වියදම රු'000** |
|---|---|---|
| 1. | 15,800 | 12,900 |
| 2. | 16,200 | 13,300 |
| 3. | 15,200 | 12,300 |
| 4. | 15,200 | 11,300 |
| 5. | 15,900 | 13,000 |

(..............)

(20) LKAS - 02 "තොග" ප්‍රමිතයට අනුව නිවැරදි නොවන ප්‍රකාශනය වන්නේ මින් කවරක් ද?

1. මිලට ගැනුම් පිරිවැය ගණනය කිරීමේදී ගැනුම් මිලෙන් වෙළඳ වට්ටම් හා ප්‍රතිදාන අඩු කළ යුතුය.
2. ගබඩා පිරිවැය කිසිවිටකත් තොග පිරිවැයට ඇතුළත් නොකළ යුතු අයිතමයකි.
3. තොග විකුණනු ලැබූ විට විකුණූ තොග සම්බන්ධයෙන් පොත්වල පවතින අගය (ධාරණ අගය) විකුණනු ලැබූ කාලච්ඡේදයට අදාළ වියදමක් ලෙස සැලකේ.
4. තොගවල පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට තොගය ගණනය කිරීමේදී අයිතම් ක්‍රමය මත හෝ කාණ්ඩ ක්‍රමය මත තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය තීරණ කිරීම කළ හැකි වේ.
5. විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය නිෂ්පාදන ඒකක අතර බෙදා හැරීමේදී නිපද වූ සත්‍ය ඒකක ගණන පදනම් කර ගත යුතු වේ.

(..............)

(21) LKAS - 07 "මුදල් ප්‍රවාහ ප්‍රකාශන" ප්‍රමිතිය අනුව පහත සඳහන් අයිතම අදාළ වන නිවැරදි මුදල් ප්‍රවාහ වර්ග අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ මින් කවරක් ද?

A - වෙනත් පොදු සමාගමක, දිගු කාලීන ණයකර මිලට ගැනීමට ගෙවූ මුදල්
B - එම ණයකර සඳහා පළමු වර්ෂය අවසානයේදී මුදලින් ලද පොලී
C - ගෙවූ පොලී හැර කල්බදු වාරික මුදල්
D - මුදලින් ලද කොමිස් ආදායම්

1. මූල්‍ය, ආයෝජන, මූල්‍ය, ආයෝජන
2. ආයෝජන, ආයෝජන, මූල්‍ය, ආයෝජන
3. මූල්‍ය, ආයෝජන, මූල්‍ය, මෙහෙයුම්
4. ආයෝජන, ආයෝජන, මූල්‍ය, මෙහෙයුම්
5. ආයෝජන, ආයෝජන, මෙහෙයුම්, ආයෝජන

(..............)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(22) LKAS - 08 '' ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි'' ප්‍රමිතය අනුව නිවැරදි වන්නේ පහත කුමන ප්‍රකාශනය/ ප්‍රකාශන ද?

A - ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීමක් සෑම විටම සිදු කළ හැක්කේ ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් වෙනසක් ඉල්ලා ඇති විට පමණි.

B - ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් නිසා අතීත කාලපරිච්ඡේදයන්ගේ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු වෙනසක් සිදු නොකළ යුතුය.

C - අතීත කාලපරිච්ඡේද වැරදි, නිවැරදි කිරීමේදී එය අතීත කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශනවලට බලපාන පරිදි ගැලපිය යුතුය.

D - පවතින ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට මාරු කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනසක් වේ.

1. B, C සහ D පමණි. 2. B හා C පමණි. 3. A, B සහ C පමණි
4. B සහ D පමණි. 5. A, B, C සහ D යන සියල්ලම (..............)

(23) සීමිත මාලන් පොදු සමාගමේ ගිණුම් වර්ෂය 2026.03.31 දිනෙන් අවසන් වූ අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම 2026.05.25 දින අවසන් විය. 2026.06.05 දින අධ්‍යක්ෂකවරු විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී. 2026.03.31 දිනට පසුව සිදු වූ සිද්ධීන් කිහිපයක් පහත වේ.

1. 2026.03.31 දිනට පැවති ගොඩනැගිල්ලක් 2026.04.18 දින ඇති වූ ගින්නක් හේතුවෙන් සම්පූර්ණයෙන්ම විනාශ විය. එම ගොඩනැගිල්ලේ එදිනට ධාරණ අගය රු. 1,550,000 කි.
2. 2026.03.31 දිනට පැවති වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය තුළ ඇතුළත් රු. 850,000 ශේෂයක් ඇති ණයගැතියෙකු බුන්වත් වූ බව 2026.04.30 දින අධිකරණය විසින් තීරණය කරන ලදී.
3. 2026.04.05 දින අත්පත් කරගත් භාණ්ඩ තොගයක් රු. 25,000 ක වියදමක් දරා 2026.05.10 දින රු. 325,000 කට විකුණන ලදී.
4. සමාගම විසින් සේවයෙන් ඉවත් කරන ලද සේවකයෙකු විසින් 2025.12.01 දින සමාගමට විරුද්ධව පැවරූ නඩුවක තීන්දුව 2026.05.26 දින ලබා දුන් අතර, ඒ අනුව සමාගම විසින් රු. 350,000 ක වන්දි මුදලක් එදින සේවකයාට ගෙවන ලදී. 2026.03.31 දිනට මේ සඳහා ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

LKAS - 10''වාර්තා කරන කාලච්ඡේදයට පසුව ඇති වූ සිදුවීම්'' ප්‍රමිතය අනුව ඉහත සිද්ධීන් සැලකිල්ලට ගැනීමෙන් 2025.12.01 දිනෙන් අවසන් වර්ෂයේ ලාභයට සහ එදිනට පැවති සමාගමේ මුළු වත්කම්වලට එදිනට ඇති වූ බලපෑම වන්නේ,

| | වර්ෂයේ ලාභයට ඇති වූ බලපෑම | මුළු වත්කම් වලට ඇති වූ බලපෑම |
|---|---|---|
| 1. | රු. 2,400,000 කින් අඩු වේ. | රු. 2,150,000 කින් අඩු වේ. |
| 2. | රු. 1,200,000 කින් අඩු වේ. | රු. 1,200,000 කින් අඩු වේ. |
| 3. | රු. 1,200,000 කින් අඩු වේ. | රු. 2,750,000 කින් අඩු වේ. |
| 4. | රු. 2,400,000 කින් අඩු වේ. | රු. 2,400,000 කින් අඩු වේ. |
| 5. | රු. 1,200,000 කින් අඩු වේ. | රු. 850,000 කින් අඩු වේ. |

(..............)

(24) 2025.04.01 දින මෝටර් රථයක භාවිත අයිතිය ලබාගැනීම සඳහා සීමිත සතිල් සමාගම කල්බදු ගිවිසුමකට එළඹුන අතර, ඊට අදාළව පහත තොරතුරු සපයා ඇත.

| | රු'000 |
|---|---|
| මූලික ගෙවීම | 2,000 |
| කල්බදු වගකීමේ මූලික මිනුම් කිරීම | 7,000 |
| දරන ලද මූලික සෘජු පිරිවැය | 600 |

- ❖ මෝටර් රථයෙහි ඵලදායී ජීව කාලය වර්ෂ 08 ක් වන අතර වසර 8කට පසුව එහි සුන්බුන් වටිනාකම රු. 1,600,000 කි.
- ❖ කල්බදු කාලය වර්ෂ 6 ක් වන අතර කල්බදු කාලය අවසානයේදී මෝටර් රථයේ අයිතිය කල්බදු ගැනුම්කරුට හිමි නොවේ.

SLFRS - 16 (කල්බදු) ප්‍රමිතයට අනුව 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම මෝටර් රථයේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය කොපමණද?

1. රු. 1,600,000 කි. 2. රු. 1,200,000 කි. 3. රු. 1,000,000 කි.
4. රු. 960,000 කි 5. රු. 1,400,000 කි. (..............)

(25) සීමිත මල්කි පොදු සමාගමේ 2025.04.01 දිනට මුළු හිමිකම රු. 9,900,000 ක් විය. එහි රු. 1,900,000 ක රඳවා ගත් ඉපැයුම් ඇතුළත්ව තිබූ අතර 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී රු. 1,000,000 ක සංචිත ප්‍රාග්ධනීත කර ඇති අතර, ඒ සඳහා රඳවා ගත් ඉපැයුම් උපයෝගී කරගෙන ඇත.

අනෙකුත් තොරතුරු,

- වර්ෂය තුළ රු. 50/- ක ප්‍රතිශ්ඨාවකට සාමාන්‍ය කොටස් 50,000 ක හිමිකම් නිකුතුවක් සිදු කර ඇති අතර ඊට අදාළ මුළු ප්‍රතිශ්ඨාව නිසි පරිදි සාමාගමට ලැබී ඇත.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාලච්ඡේදයේ ලාභය රු. 2,000,000 ක් වූ අතර, මුළු විස්තීරණ ආදායම රු. 2,800,000 කි.
- 20026.03.17 දින පොදු සංචිතයට රඳවාගත් ඉපයුම් වලින් කොටසක් මාරු කර ඇත.

20026.03.31 දිනට සියලු ගැලපුම්වලට පසු රඳවාගත් ඉපයුම් ගිණුමේ ශේෂය රු. 2,400,000 ක් වේ නම් සියලු ගනුදෙනුවලට පසු 2026.03.31 දිනට සමාගමේ මුළු හිමිකම වන්නේ, (රු'000)

1. රු. 10,500 2. රු. 15,200 3. රු. 16,700
4. රු. 14,700 5. රු. 13,700 (..............)

(26) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත ඉමාෂා සමාගමට අදාළව පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| 2026.03.31 තොගය | 120,000 |
| 2025.04.01 තොගය | 160,000 |
| තොග රැඳවුම් කාලය | දින 60 |
| දළ ලාභ අනුපාතය | 30% |

- **වර්ෂය සඳහා වැඩ කරන දින ගණන 360 ක් වේ.**

2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා විකුණුම් ආදායම කොපමණද?

1. රු. 840,000 කි. 2. රු. 960,000 කි. 3. රු. 1,200,000 කි.
4. රු. 800,000 කි. 5. රු. 1,092,000 කි. (..............)

(27) නිෂ්පාදන සමාගමක නිපදවන භාණ්ඩ ඒකකයක් සඳහා "P" නමැති අමුද්‍රව්‍ය ඒකක 2ක් අවශ්‍ය වේ.

- මෙම භාණ්ඩයේ මාසික අවම නිෂ්පාදනය ඒකක 2500 කි.
  උපරිම මාසික නිෂ්පාදනය ඒකක 3750 කි.
- P නමැති අමුද්‍රව්‍ය සඳහා අවම පොරොත්තු කාලය මාස 02ක් වන අතර සාමාන්‍ය පොරොත්තු කාලය මාස 04 කි.
  "P" අමුද්‍රව්‍ය සඳහා යළි ඇණවුම් මට්ටම හා අවම තොග මට්ටම වන්නේ,

| | **යළි ඇණවුම් මට්ටම (ඒකක)** | **අවම තොග මට්ටම (ඒකක)** |
|---|---|---|
| 1. | 45000 | 20000 |
| 2. | 22500 | 20000 |
| 3. | 45000 | 10000 |
| 4. | 90000 | 40000 |
| 5. | 57500 | 20000 |

(..............)

(28) නිෂ්පාදන සමාගමක 2026.09.30 න් අවසන් කාර්තුව සඳහා ඇස්තමේන්තුගත තොරතුරු කිහිපයක් පහත වේ.

- ඒකකයක පිරිවැය
  - ප්‍රාථමික පිරිවැය රු. 60
  - පොදු කාර්ය පිරිවැය
    - සැකසුම් අංශය රු. 15
    - නිමවුම් අංශය රු. 25
  - රු. 100

- ඒකකයක් නිපදවීමට සැකසුම් අංශයේ යන්ත්‍ර පැය 3 ක් ද නිමවුම් අංශයේ ශ්‍රම පැය 2 ක් ද අවශ්‍යවේ.
- සැකසුම් අංශයේ අයවැය ගත මුළු යන්ත්‍ර පැය ගණන 840,000 ක් වන අතර නිමවුම් අංශයේ අයවැය ගත ශ්‍රම පැය ගණන 400000 කි.
- ඒකකයක පිරිවැය ඇස්තමේන්තු කිරීමේදී රු. 1,440,000 ක් වූ කාර්තුවකට අදාළ කම්හල් කුලිය සැලකිල්ලට ගෙන නැත.
- එක් එක් අංශයේ භූමි ප්‍රමාණය පහත වේ.

| | |
|---|---|
| සැකසුම් අංශය | 35000 $m^2$ |
| නිමවුම් අංශය | 25000 $m^2$ |

සියලුම පිරිවැය අයිතම සැලකිල්ලට ගත් විට ඒකකයක ඇස්තමේන්තුගත පිරිවැය වටිනාකම කොපමණද?

1. රු. 110 2. රු. 120 3. රු. 112 4. රු. 106 5. රු. 115 (..............)

(29) ''නැණසි'' නිෂ්පාදන සමාගමේ ඒකක 50000 ක ක්‍රියාකාරී මට්ටමට අදාළව පහත තොරතුරු ඔබට සපයා ඇත.

| | රු.'000 |
|---|---|
| මුළු දායකය | 2,500 |
| විකුණුම් ආදායම | 6,000 |
| සමච්ඡේදන ලක්ෂ්‍යයේදී විකුණුම් වටිනාකම | 3,600 |

සමාගමේ ඒකකයක විචල්‍ය පිරිවැය සහ මුළු ස්ථාවර පිරිවැය (රු'000)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

| | ඒකකයක විචල්‍ය පිරිවැය රු'000 | මුළු ස්ථාවර පිරිවැය රු'000 |
|---|---|---|
| 1. | 50 | 3,500 |
| 2. | 50 | 1,500 |
| 3. | 70 | 3,000 |
| 4. | 70 | 1,500 |
| 5. | 30 | 3,000 |

(..............)

(30) ප්‍රාග්ධන ආයෝජන තීරණවලට අදාළව පහත ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.,

A - ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ලබාගන්නා දිගු කාලීන බැංකු ණයක් මගින් ලැබෙන මුදල් ආරම්භක මුදල් ප්‍රවාහයක් (ගලා ඒමක්) ලෙස සැලකිය යුතුය.

B - ආයෝජන ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීමේදී මුදලේ කාලීන අගය සැලකිල්ලට ගනී.

C - ව්‍යාපෘතියක මුළු මුදල් ගලා ඒම්වල වටිනාකම මුළු මුදල් ගලා යාම්වල වටිනාකමට සමාන වීමට ගතවන කාලය එහි පිළිගෙවුම් කාලයයි.

D - ශුද්ධ වර්තමාන අගය මත ව්‍යාපෘති ඇගයීමේදී මුදල් ගලා ඒම් වල වර්තමාන අගය සහ මුදල් ගලායාම් වල වර්තමාන අගය සමාන වන විට එම ව්‍යාපෘතිය තෝරා ගැනීම වඩා සුදුසු වේ.

ඉහත ප්‍රකාශන අතරින්,

1. C හා D පමණක් නිවැරදි වේ.
2. C පමණක් නිවැරදි වේ.
3. B, C හා D පමණක් නිවැරදි වේ.
4. D පමණක් නිවැරදි වේ.
5. A හා C පමණක් නිවැරදි වේ.

(..............)

- **අංක (31) සිට (50) දක්වා ප්‍රශ්නවලට කෙටි හා නිශ්චිත පිළිතුරු අදාළ හිස්තැනෙහි ලියා දක්වන්න.**

(31) මෑත කාලීනව සිදුවූ පරිසර බලපෑම් කිහිපයක් පහත වේ.

A - මැද පෙරදිග යුධමය තත්වය හේතුවෙන් ආනයනික භාණ්ඩවල මිල ඉහළ යාම.

B - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වෙනසකට ලක් කරමින් නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත හඳුන්වා දීම.

C - ගිණුම්කරණ තොරතුරු සම්පාදනය කාර්යක්ෂම කරමින් නව ගිණුම්කරණ මෘදුකාංග බිහි වීම.

D - 2025 අංක 19 දරණ ජාතික විගණන (සංශෝධිත) පනත පාර්ලිමේන්තුවේදී සම්මත වීම.

ඉහත සඳහන් පරිසර බලපෑම් අයත් වන ගිණම්කරණ පරිසර සාධකය හඳුනාගෙන අදාළ අක්ෂරය, පරිසර සාධකය ඉදිරියෙන් ලියා දක්වන්න,

| | | පරිසර බලපෑම |
|---|---|---|
| 1. | ශිල්පීය හා වෘත්තිය පරිසරය | .................................................. |
| 2. | ආර්ථික හා දේශපාලන පරිසරය | .................................................. |
| 3. | තාක්ෂණික පරිසරය | .................................................. |
| 4. | නෛතික පරිසරය | .................................................. |

(32) තනි පුද්ගල ව්‍යාපාරයක් වන ගයත්‍රීගේ ව්‍යාපාරයේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ වත්කම් රු. 2,600,000 කින් වැඩි වී ඇති අතර, වගකීම් රු. 700,000 කින් අඩු වී ඇත. එනමුත් එම වෙනස්වීම් හඳුනාගැනීමේදී 2025.10.01 දින ලබාගත් රු. 500,000 ක බැංකු ණය පිළිබඳව සැලකිල්ලට ගෙන නැත.

➢ පහත තොරතුරු 2025/2026 වර්ෂයට අදාළ වේ.
  - ගයත්‍රීගේ අමතර ප්‍රාග්ධන යෙදවීම් රු. 150,000
  - ගයත්‍රීගේ මාසික මුදල් ගැනිලි රු. 25,000
  - 2026.01.01 දින සිදු කළ භාණ්ඩ ගැනිලි රු. 105,000

2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා ගයත්‍රීගේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය/අලාභය වන්නේ, (රු'000)

.................................................................................................................................................................

- **ප්‍රශ්න අංක (33) සහ (34) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම සඳහා පහත තොරතුරු අදාළ කරගන්න.**

එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක පහත ගනුදෙනු සිදු වී ඇත. එම ගනුදෙනුවලට අදාළව කිසිවක් ව්‍යාපාරය විසින් ගිණුම්ගත කර නැත.

1. රු. 300,000 ක වෙළඳ ගෙවිය යුතු ඇ ශේෂයක් පියවීම සඳහා රු. 20,000 ක මුදල් වට්ටමක් අඩුකර අයිතිකරු තම පුද්ගලික ජංගම ගිණුමෙන් චෙක්පතක් නිකුත් කිරීම.
2. රු. 1,500,000 ක දිගු කාලීන ණයක් ලබා ගත් අතර ඒ සඳහා ගෙවිය යුතු වාර්ෂික පොලිය 12% කි.
3. රු. 177,000 (18% ක VAT සහිත) කට වෙළඳ බඩු තොගයක් ණයට විකුණු අතර ඒවායේ පිරිවැය රු. 120,000 කි.
4. පළමු (1) ගනුදෙනුවට අදාළව ණයහිමියන් වෙත නිකුත් කරන ලද චෙක්පත අගරු වූ අතර ඒ මත ලද වට්ටම ද අහිමි කර ඇත.

PAST PAPERS WIKI



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

(33) ඉහත ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ පසු පහත අයිතමයන්ට ඇති වන ශුද්ධ බලපෑම වටිනාකම සමග දක්වන්න.

| | බලපෑම (අඩුවේ/වැඩි වේ/වෙනස් නොවේ) | වටිනාකම රු'000 |
|---|---|---|
| A - හිමිකම | ........................................................ | ................................................ |
| B - වගකීම් | ........................................................ | ................................................ |

(34) ඉහත අංක 3 සහ 4 ගනුදෙනු ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන් ලියා දක්වන්න.

| ගනුදෙනු අංකය | විස්තරය | හර රු.'000 | බැර රු.'000 |
|---|---|---|---|
| 3 | ..................................................................................<br>..................................................................................<br>.................................................................................. | ......................<br>......................<br>...................... | ......................<br>......................<br>...................... |
| 4 | ..................................................................................<br>..................................................................................<br>.................................................................................. | ......................<br>......................<br>...................... | ......................<br>......................<br>...................... |

(35) ගිණුම්කරණ සංකල්පවලට අදාළ පහත ප්‍රකාශනයන් සත්‍ය (T) / අසත්‍ය (F) බව ඉදිරියෙන් සඳහන් කරන්න.

| | සත්‍ය (T) / අසත්‍ය (F) |
|---|---|
| A - යථාරූපී සංකල්පය අනුව භාවිත අයිති වත්කමක වාර්ෂික ක්ෂය වියදමක් ලෙස ආදායමට එරෙහිව කපා හරී. | ................................................ |
| B - ව්‍යාපාරයක ණයගැතියන් සහ ණයහිමියන් ද හඳුනාගැනීමට පදනම සපයන්නේ කාලච්ඡේද සංකල්පය මගිනි. | ................................................ |
| C - සෑම ගිණුම්කරණ ඒකකයකටම අඛණ්ඩ පැවැත්මක් ඇති බව ගිණුම්කරණ ඒකක සංකල්පයේ මූලික උපකල්පනයයි. | ................................................ |
| D - දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන ආකෘතිය මත නිරූපණය කිරීමෙන් ඓතිහාසික පිරිවැය සංකල්පය ආරක්ෂා කෙරේ. | ................................................ |

(36) පහත සඳහන් පොදු ලෙජර ගිණුම් අයත් වන නිවැරදි ගිණුම් වර්ගය සඳහන් කරන්න.

| | ගිණුම් වර්ගය |
|---|---|
| A - පොදු සංචිත ගිණුම | ................................................ |
| B - සමුච්චිත ක්ෂය ගිණුම | ................................................ |
| C - ආදායම් බදු ප්‍රතිපාදන ගිණුම | ................................................ |
| D - ගෙවූ ලාභාංශ ගිණුම | ................................................ |

(37) සීමිත තරුලි පොදු සමාගම 2026.03.31 දිනට තොග සම්බන්ධව කළ යුතු ගැලපීම් කිසිවක් සිදු කර නැති අතර, එදින සිදු කළ භෞතික තොග පරීක්ෂාවට අනුව රු. 188,000 ක් පිරිවැය වූ තොගයක් ගබඩාව තුළ පැවතිණි. පහත අතිරේක තොරතුරු ද තොග හා සම්බන්ධ වේ.

1. 2026 මාර්තු 28 දින සිදු කළ ණයට ගැනුම් ඉන්වොයිසියකට අදාළ පිරිවැය රු. 14,500 ක තොග මාර්තු 31 වන විටත් මාර්ගස්ථව පැවතිණි.
2. 2026 මාර්තු දින ඉන්වොයිස් මිල රු. 40,000 ක් වූ තොගයක් විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත ගනුදෙනුකරුවෙකු වෙත යවා ඇත. මේවා ඉන්වොයිස් කර තිබුණේ පිරිවැයට $\frac{1}{3}$ක ලාභයක් ලැබෙන පරිදි වන අතර එම මුළු තොගයෙන් 75% ක් විකුණා ඇති බව ගනුදෙනුකරු විසින් දන්වා එවා ඇති අතර ඒ පිළිබඳව නිසි පරිදි ගිණුම් තබා ඇත. ගනුදෙනුකරු වෙත ඇති ඉතිරි භාණ්ඩ තොගයේ ආපසු හරවා එවීමේ කාලය මාර්තු 31 වන විටත් ඉක්මවා ගොස් නොමැත.
3. 2026 මාර්තු 31 දිනට නිවැරදි තොග පිරිවැය තීරණය කළ පසුව ඒවායේ ශුද්ධ උපලබ්ධි අගය තක්සේරු කර ඇති අතර එහිදී මුළු තොගයේ අපේක්ෂිත විකුණුම් මිල රු. 225,000 ක් ලෙසත් අපේක්ෂිත නිම කිරීමේ හා විකුණුම් වියදම රු. 25,000 ක් ලෙසත් ඇස්තමේන්තු කර ඇත.

අ. 2026 මාර්තු 31 දිනට හඳුනාගත යුතු නිවැරදි තොග පිරිවැය කොපමණද?

..........................................................................................................................................................

ආ. 2026 මාර්තු 31 දිනට තොග ගැලපීම නිසා 2026.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභයට ඇති වන ශුද්ධ බලපෑම කොපමණද?

| වටිනාකම | ශුද්ධ බලපෑම |
|---|---|
| රු. ........................................................ | අඩු වේ/වැඩි වේ. |



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(38) අමා සහ ඉමා පළිවෙළින් 2 : 1 ලාභාලාභබෙදාගත් හවුල් ව්‍යාපාරයේ 2025.04.01 දිනට පැවති හිමිකමේ සංයුතිය පහත වේ.

| | **ප්‍රාග්ධන ගිණුම් රු'000** | **ජංගම ගිණුම් රු'000** |
|---|---|---|
| අමා | 3,800 | 200 |
| ඉමා | 2,400 | 300 |

- 2026.03.31 දින ලාභයෙන් $\frac{1}{4}$ක හිමිකමක් සහිතව චනු හවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. චනු රු. 2,500,000 ක මෝටර් රථයක් සහ රු. 500,000 ක මුදලක් එදිනට ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට යොදවන ලදී. මෙදිනට කිර්ති නාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම මගින් ගැලපුම් කල අතර, අදාළ ගැලපුම්වලට පසු 2026.04.01 දිනට චනුගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 2,550,000 ක් විය.
- 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ අදාළ ගැළපීම් හේතුවෙන් අමාගේ ජංගම ගිණුම් ශේෂය රු. 125,000 කින් ද ඉමාගේ ජංගම ගිණුම් ශේෂය රු. 175,000 කින් ද ඉහළ ගොස් ඇත.

අ) 2026.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂ,

අමා රු. (රු'000) ..........................................................................

ඉමා රු. (රු'000) ..........................................................................

ආ) 2026.04.01 දිනට ව්‍යාපාරයේ මුළු හිමිකම කොපමණද? (රු'000)

..........................................................................................................................

(39) හවුල් ව්‍යාපාරයක ගිණුම් තැබීමට අදාළ පහත ප්‍රකාශන සම්පූර්ණ කරන්න.

A - ලිඛිත හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවක හවුල් අඥා පනතේ ............................................ වගන්තිය අනුව කටයුතු කළ යුතුය.

B - හවුලක අයිතිය වෙනස්වීමකදී කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුමෙන් ගැළපීම නිසා ව්‍යාපාරයේ මුළු .............................................................. වෙනසක් සිදු නොවේ.

C - හවුල් ව්‍යාපාරයක ....................................................... හවුල්කරුවකු විසින් පුද්ගලිකව ගෙවා ඇති විට එය .................................. කළ යුතු වේ.

(40) LKAS - 37 ප්‍රතිපාදනයන්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියට අනුව පහත ප්‍රකාශ සත්‍ය (T) ද අසත්‍ය ද (F) යන වග දක්වන්න.

| | සත්‍ය (T) / අසත්‍ය (F) |
|---|---|
| A - ප්‍රතිපාදනයක් හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් එය ආදායම් ප්‍රකාශනය තුළ වියදමක් ලෙස හඳුනාගත හැක. | ........................................... |
| B - අනාගතයේදී ඇති විය හැකි මෙහෙයුම් අලාභයක් සඳහා ප්‍රතිපාදනයක් හඳුනාගැනීමට නම් එය විශ්වාසදායී ලෙස මැනිය හැකි විය යුතුය. | ........................................... |
| C - අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශනය තුළ හඳුනා නොගන්නා බැවින් ඒවා මිනුම් කිරීම අවශ්‍ය නොවේ. | ........................................... |
| D - අසම්භාව්‍ය වත්කමක් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත හැකි වන්නේ එමඟින් අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමක් අපේක්ෂා කරන්නේ නම් පමණි. | ........................................... |

(41) සීමිත විජිත් පොදු සමාගම 2026.01.01 දින ගනුදෙනුකරුවකු සමග ගිවිසුමක් ඇති කරගත් අතර, එම ගිවිසුමේ ඇතුළත් කාර්යසාධන බැදීම් සහ ඒවායේ සාපේක්ෂ තනි විකුණුම් මිල ගණන් පහත පරිදි වේ.

| **කාර්යසාධන බැදීම** | **සාපේක්ෂ තනි විකුණුම් මිල (රු.)** |
|---|---|
| නිෂ්පාදන යන්ත්‍රය සැපයීම | 180,000 |
| ස්ථාපනය කිරීම | 30,000 |
| සේවා සැපයීම | 90,000 |

- ස්ථාපනය කිරීම සහ සේවා සැපයීම වෙළඳපොළේ සිටින වෙනත් සැපයුම්කරුවකුගෙන් ලබා ගැනීමට ගනුදෙනුකරුට හැකියාව ඇත.
- ඉහත සියලු ප්‍රතිලාභ හිමිකර ගැනීම සඳහා ගනුදෙනුකරු එකඟ වී යන්ත්‍රය 2026.01.31 දින ගනුදෙනුකරුගේ පරිශ්‍රය වෙත භාරදී ස්ථාපනය කිරීම ද අවසන් කරන ලදී.
- මෙම ගිවිසුමේ මුළු ප්‍රතිශ්‍යාව රු. 240,000 ක් වන අතර, එය 2026.01.31 දින ගනුදෙනුකරු විසින් ගෙවන ලදී.
- සේවා සැපයීමේ කොන්දේසි අනුව මාස 2කට වරක් වසරක් ඇතුළත සේවා වාර 6ක් සැපයිය යුතුය. පළමු සේවා වාරය 2026.03.31 දින සපයා ඇත.
- සමාගම නිෂ්පාදන යන්ත්‍රය සැපයීම වෙනුවෙන් වට්ටම් ලබා නොදේ.

SLFRS - 15 (අයභාරය) ප්‍රමිතයට අනුව මෙම ගිවිසුමට අදාළව සීමිත විජිත් පොදු සමාගම විසින් 2026.03.31 දිනට හඳුනාගත යුතු අයභාරය සහ එදිනට නොඉපයූ අයභාරය කොපමණද?

A - හඳුනාගත යුතු අයභාරය (රු.) ..........................................................................

B - නොඉපයූ අයභාරය (රු.) ..........................................................................

(42) මූල්‍යවාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව (2018) අනුව පහත ප්‍රකාශනයන් සම්පූර්ණ කරන්න.

A - තොරතුරු භාවිත කරන පාර්ශවවල තීරණ වෙනස් කිරීමට මූල්‍ය ප්‍රකාශනවල තොරතුරුවලට හැකියාවක් ඇත්නම් එම තොරතුරු ....................................................................... යුක්ත වේ.

B - ......................................................... යනු ආර්ථික ප්‍රතිලාභ උපදවීමේ ........................................ ඇති අයිතියකි.

C - තොරතුරු විශ්වාසනීය ලෙස නිරූපණය කිරීම සඳහා තොරතුරු සම්පූර්ණ සහ ........................................................ විය යුතු අතර, වැරදි වලින් තොර විය යුතුය.



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

(43) සීමිත නන්ද පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මුදල් ප්‍රවාහයන්ට අදාළව පහත තොරතුරු සපයා ඇත.

| | රු'000 |
|---|---|
| 2025.04.01 මුදල් හා මුදල් සමාන දෑ | 1,530 |
| 2026.03.31 මුදල් හා මුදල් සමාන දෑ | 5,000 |
| බදු පෙර ශුද්ධ ලාභය | 1,150 |
| ආදායම් බදු හා පොලී ගෙවීම් | 300 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් | 500 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් | 2,070 |
| 2025/2026 වර්ෂය තුළ | |
| - ජංගම වත්කම් වැඩිවීම (මුදල් හා මුදල් සමාන දෑ හැර) | 250 |
| - ජංගම වගකීම් අඩුවීම (උපචිත බදු හා පොලී හැර) | 150 |
| වර්ෂයේ පොලී වියදම | 550 |

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ දේපළ, පිරියත හා උපකරණ ක්ෂය ප්‍රමාණය කොපමණද?

..............................................................................................................................

(44) කළමනාකරණ ගිණුම්කරණය තුළ පිරිවැයකරණයට අදාළව ඉදිරිපත් කර ඇති පහත ප්‍රකාශනවල සත්‍ය (T) අසත්‍ය (F) බව දක්වන්න.

| | සත්‍ය (T) අසත්‍ය (F) |
|---|---|
| A - ගිලුණු පිරිවැය සහ ආවස්ථික පිරිවැය, පාලන කාර්ය සඳහා පිරිවැය වර්ගීකරණයේදී සලකා බලන පිරිවැය වර්ග දෙකකි. | ........................................ |
| B - ගබඩා ලෙජරය පිළියෙළ කිරීමේදී භාණ්ඩ ලැබීම් පත්‍රය සහ ද්‍රව්‍ය අධියාචනා පත්‍රය මූලාශ්‍ර ලේඛන ලෙස භාවිතා කරයි. | ........................................ |
| C - තොග මට්ටම් පවත්වාගෙන යාම තොග පාලන ශිල්ප ක්‍රමයක් ලෙස පිරිවැය පාලනයේදී යොදා ගනී. | ........................................ |
| D - ඍජු පිරිවැය නිෂ්පාදන ඒකකවලට ඇතුළත් කිරීමේදී පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. | ........................................ |

(45) 2026.03.31 දිනට පොදු සමාගමකට අදාළව පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| ජංගම අනුපාතය | වාර 03 |
| ජංගම වත්කම් | රු. 180,000 |
| 2025.04.01 තොගය | රු. 32,000 |
| සාමාන්‍ය තොගය | රු. 40,000 |
| තොග පිරිවැටුම් අනුපාතය | වාර 08 |
| දළ ලාභ අනුපාතය | 20% |

අ. 2026.03.31 දිනට සමාගමේ, ක්ෂණික වත්කම් අනුපාතය කීයද?

..............................................................................................................................

ආ. 2026.03.31 දිනෙන් අවසන් වසර සඳහා විකුණුම් වටිනාකම කොපමණද?

..............................................................................................................................

(46) ව්‍යාපාරයක 2026 ජනවාරි මස වැටුප් හා වේතනවලට අදාළව පහත තොරතුරු සපයා ඇත.

- ශුද්ධ වැටුප — රු. 1,740,000
  - අඩුකිරීම් :- සේවක ණය අය කිරීම් — රු. 160,000
  - වැටුප් අත්තිකාරම් — රු. 70,000
  - වෘත්තිය සමිති දායකය — රු. 10,000
  - EPF සේවක දායකය දළ වැටුපෙන් 10% කි.
- වෙනත් අඩු කිරීම් කිසිවක් ජනවාරි මාසයට අදාළව නොපැවතුණි.
- දළ වැටුපෙන් 15% ක් හා 3% ක පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදල (EPF) ට හා සේවක භාරකාර අරමුදලට (ETF) ආයතනය (සේව්‍යයා) විසින් දායක වේ.

අ. ජනවාරි මස සේවකයන්ට අදාළ මුළු වියදම ලෙස ලාභයෙන් කළ යුතු අඩු කිරීම කොපමණද?

..............................................................................................................................

ආ. සේවක භාරකාර අරමුදල් (ETF) දායකය ගිණුම් තැබීමේ ද්විත්ව සටහන (වටිනාකම සමඟ) දක්වන්න.

..............................................................................................................................



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(47) නිෂ්පාදන අංශ දෙකක් සහ එක් සේවා අංශයක් පවතින නිෂ්පාදන ආයතනයක නිෂ්පාදිතයකට අදාළ ඇස්තමේන්තු ගත තොරතුරු කිහිපයක් පහත වේ.

| | | රු. |
|---|---|---|
| ඒකකයක පිරිවැය → | සෘජු ද්‍රව්‍ය | 150 |
| | සෘජු ශ්‍රමය | 120 |
| | සෘජු වෙනත් | 30 |
| | පොදු කාර්ය පිරිවැය | 150 |
| | | 450 |

- ඒකකයක් නිපදවීම සඳහා එකලස් අංශයේ යන්ත්‍ර පැය 4 ක් ද නිමැවුම් අංශයේ ශ්‍රම පැය 2 ක් ද වැය වේ.
- එකලස් අංශයේ පොදු කාර්ය පිරිවැය යන්ත්‍ර පැය පදනමට අන්තර්ග්‍රහණය කරන අතර, අන්තර්ග්‍රහණ අනුපාතය යන්ත්‍ර පැයකට රු. 20 කි.
- එකලස් අංශයේ ඇස්තමේන්තුගත මුළු යන්ත්‍ර පැය ගණන 20,000 ක් වන අතර, නිමැවුම් අංශයේ ඇස්තමේන්තුගත මුළු ශ්‍රම පැය ගණන 10,000 කි.
- සේවා අංශයේ ඇස්තමේන්තුගත මුළු පොදු කාර්ය පිරිවැය රු. 150,000 කි.

අ. නිමැවුම් අංශයේ ඇස්තමේන්තු ගත මුළු පොදු කාර්ය පිරිවැය කොපමණද?

.............................................................................................................................................

ආ. නිෂ්පාදිතය වෙනුවෙන් ඇස්තමේන්තුගත මුළු පොදු කාර්ය පිරිවැය කොපමණද?

.............................................................................................................................................

(48) සීමිත දුලන්සා පොදු සමාගම නිෂ්පාදන ව්‍යාපාරයක් වන අතර 2026.03.31 දිනෙන් අවසන් කාර්තුව සඳහා පහත පිරිවැය තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| නිෂ්පාදිත ඒකක ගණන | 50,000 |
| මුළු පිරිවැය (රු'000) | 15,000 |
| ඒකකයක විචල්‍ය පොදු කාර්ය පිරිවැය | රු. 70 |
| මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (රු'000) | 5,000 |

අනෙකුත් තොරතුරු,

මුළු විචල්‍ය පිරිවැය, මුළු පිරිවැයෙන් 60% ක් වන අතර ප්‍රාථමික පිරිවැය තුළ ඇතුළත් වන්නේ විචල්‍ය පිරිවැය පමණි. පහත දෑ ගණනය කර දක්වන්න.

අ. මුළු ප්‍රාථමික පිරිවැය (රු'000) .............................................................................

ආ. මුළු නිෂ්පාදන පිරිවැය (රු'000) .............................................................................

ඉ. මුළු නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය (රු'000) ..................................................

(49) සීමිත අනුජ සමාගම තම උපරිම නිෂ්පාදන ධාරිතාවය වන ඒකක 2000 න් 75% ක ධාරිතාවයකින් වර්තමානයේ ක්‍රියාත්මක වෙමින් පවතී. සමාගමේ වර්තමාන ක්‍රියාකාරී මට්ටමේදී පිරිවැය තොරතුරු පහත වේ.

| | රු. |
|---|---|
| ඒකකයක සෘජු ද්‍රව්‍ය පිරිවැය | 200 |
| ඒකකයක සෘජු ශ්‍රම පිරිවැය | 150 |
| මුළු විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | 225,000 |
| මුළු ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | 600,000 |

- එක් නිෂ්පාදන ඒකකයක ලැයිස්තුගත විකුණුම් මිල රු. 1,200 ක් වන අතර, සෑම ඒකකයක් සඳහාම වර්තමානයේදී රු. 200 ක වෙළඳ වට්ටමක් ලබා දෙයි.

අ. සමච්ඡේදන ලක්ෂය(රු.) වටිනාකමක් ලෙස දක්වන්න.

.............................................................................................................................

ආ. වර්තමාන ක්‍රියාකාරී මට්ටමේදී සමාගම උපයන ලාභය කොපමණද?

.............................................................................................................................

(50) සීමිත අශේනි පොදු සමාගම තම නිෂ්පාදන කටයුතු පුළුල් කිරීමේ අරමුණින් නවීන තාක්ෂණයෙන් යුතු ස්වංක්‍රීය යන්ත්‍රයක් මිලට ගැනීමට අපේක්ෂාවෙන් සිටී. මෙම යන්ත්‍රයේ අපේක්ෂිත ඵලදායී ජීව කාලය වසර 5ක් සහ සුන්බුන් අගය රු. 200,000 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, මෙම යන්ත්‍රයේ වාර්ෂික ක්ෂය රු. 300,000 කි. මෙම ව්‍යාපෘතියට අදාළව ඇස්තමේන්තු කර ඇති ශුද්ධ ලාභයන් පහත පරිදි වේ.

| **වර්ෂය** | **ශුද්ධ ලාභය (රු'000)** |
|---|---|
| 1 | 300 |
| 2 | 450 |
| 3 | 400 |
| 4 | 150 |
| 5 | 125 |

පහත දෑ ගණනය කරන්න.

අ. යන්ත්‍රයේ ඇස්තමේන්තුගත පිරිවැය, රු. ..............................................................

ආ. ව්‍යාපෘතියේ ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය, රු. ..............................................................

ඉ. ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය - ..............................................................



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | පැය / மணித்தியாலம் / Hours |
|---|---|---|---|
| 13 | ගිණුම්කරණය | II | 3 |

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

අමතර කියවීම් කාලය : - මිනිත්තු 10
අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**
* පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
* අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 200 ක් හිමි වේ.

1. සීමිත සුමෝස්සදී පොදු සමාගම නිෂ්පාදන හා වෙළඳ සමාගමකි. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමේ කෙටුම්පත් ආදායම් ප්‍රකාශය හා 2026.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත දී ඇත.

**2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් අදායම් ප්‍රකාශය**

| | රු. "000" |
|---|---|
| විකුණුම් අයභාරය | 80,000 |
| (-) විකුණුම් පිරිවැය | (35,000) |
| දළ ලාභය | 45,000 |
| වෙනත් ආදායම් | 3,000 |
| | 48,000 |
| බෙදාහැරීමේ වියදම් | (9,000) |
| පරිපාලන වියදම් | (12,000) |
| වෙනත් වියදම් | (1,000) |
| මූල්‍ය වියදම් | (2,000) |
| බදු පෙර ලාභය | 24,000 |
| ආදායම් බදු | (2,500) |
| කාලච්ඡේදයේ ලාභය | 21,500 |

**2026.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශය**

| | රු. "000" |
|---|---|
| <u>වත්කම්</u> | |
| <u>ජංගම නොවන වත්කම්</u> | |
| දේපළ පිරියත හා උපකරණ | 68,000 |
| භාවිත අයිතිය ඇති වත්කම් | 5,000 |
| | 73,000 |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

**ජංගම වත්කම්**

| | |
|---|---|
| තොග | 5,000 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 3,000 |
| වෙනත් ලැබිය යුතු දෑ | 2,500 |
| මුදල් හා මුදලට සමාන දෑ | 4,500 |
| | 88,000 |

**හිමිකම් හා වගකීම්**

| | | |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය ස/කො | | 51,000 |
| සංචිත | | |
| ප්‍රත්‍යාගණිත සංචිත (ඉඩම්) | 4,000 | |
| පොදු සංචිත | 2,000 | |
| රඳවාගත් ඉපැයුම | 25,000 | 31,000 |
| අයිතිකරුගේ හිමිකම | | 82,000 |
| වගකීම් | | |
| කල්බදු වගකීම් | | 3,000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 2,000 |
| වෙනත් ගෙවිය යුතු දෑ | | 1,000 |
| | | 88,000 |

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන කට්ටලය පිළියෙළ කිරීමට පෙර පහත තොරතුරු සැලකිල්ලට ගත යුතු වේ.

(i) 2026.03.31 දිනට තොගවල විශ්ලේෂණය පහත පරිදි වේ.

| | රු."000" |
|---|---|
| අමු ද්‍රව්‍ය | 2,000 |
| නිමි | 3,000 |
| | 5,000 |

* 2026.03.31 දිනට නිමි භාණ්ඩ නිෂ්පාදන පිරිවැයට ගණනය කර ඇත. නිෂ්පාදන පිරිවැයෙන් 10% නිමි තොගය සමන්විත වේ.
* 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සෘජු ශ්‍රමිකයන්ට ගෙවූ සෘජු වැටුප රු. 9,000,000 නිෂ්පාදන පිරිවැය තුළ අඩංගු වේ. සේවක හා සේවා යෝජක EPF දායකත්වය පිළිවෙළින් 10% ක් හා 15% ක් පිළිබඳ ගිණුම්ගත කර නොමැත.
* 2026.05.01 දින රු. 200,000 නිම කිරීමේ වියදමක් හා රු. 350,000 ක විකුණුම් වියදමක් දරා නිමි භාණ්ඩ තොගය රු. 3,650,000 කට විකුණා ඇත.
* අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශ අනුමත කළ දිනය 2026.06.02 දින වේ.

(ii) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙළ කළ ආදායම් ප්‍රකාශයේ කාලච්ඡේදයේ ලාභය රඳවාගත් ඉපැයුම් ගිණුමට බැර කර ඇත.

(iii) 2025.04.01 දිනට අදායම් බදු ප්‍රතිපාදන රු. 500,000 ක් වෙනත් ගෙවිය යුතු දෑ තුල අඩංගු වේ. 2025/2026 වර්ෂය තුළ ගෙවූ ආදායම් බදු, ආදායම් බදු ලෙස ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත. මෙම වටිනාකම තුළ 2024/2025 වර්ෂය සඳහා ගෙවූ රු. 400,000 ක ආදායම් බදු ඇතුළත් වේ. 2025/2026 වර්ෂයේ අවසන් කාර්තුවේ ආදායම් බදු වගකීම රු.600,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(iv) 2026.03.31 දිනට දේපළ පිරියත උපකරණ සංයුතිය පහත පරිදි වේ.

| වත්කම් | 2026.03.31 දිනට පිරිවැය | 2026.03.31 දිනට ධාරණ අගය | සුන්බුන් අගය | ඵලදායී ජීවකාලය |
|---|---|---|---|---|
| | (රු. 000) | (රු. 000) | (රු. 000) | වසර |
| ඉඩම් | 35,000 | 35,000 | | අසීමිතයි |
| ගොඩනැගිලි | 27,000 | 14,000 | 5,000 | 20 |
| මෝටර් රථ | 10,000 | 9,000 | 1,000 | 9 |
| යන්ත්‍ර සූත්‍ර | 16,000 | 10,000 | 2,000 | 7 |
| | 88,000 | 68,000 | | |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දේපළ පිරියත උපකරණ වලට අදාළව පහත ගනුදෙනු සිදු විය.

* 2025.04.01 දින ඉඩම් ප්‍රත්‍යාගණනය කරන ලද අතර ඉඩම් ප්‍රත්‍යාගණන ඌනතාව රු. 5000,000 වෙනත් ආදායම් ගිණුම හර කර ඉඩම් ගිණුම බැර කිරීම හැර වෙනත් කිසිදු සටහනක් සිදු කර නොමැත.

* 2025.04.01 දින යන්ත්‍ර සූත්‍ර රු. 2,000,000 ක් වැය කර නවීකරණය කරන ලදී. ඵලදායී ජීව කාලය මෙම හේතුවෙන් වසර 06 කින් වැඩි විය. සුන්බුන් අගය රු. 1,000,000 කින් වැඩි වූ අතර නවීකරණ වියදම් පරිපාලන වියදම් ලෙස ගිණුම්ගත කිරීම හැර මෙම ගනුදෙනුව සම්බන්ධව වෙනත් කිසිදු සටහනක් සිදු කර නොමැත.

* 2026.03.31 දින මෝටර් රථය රු. 9,500,000 කට විකුණූ අතර විකිණීමෙන් ලද මුදල ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ගිණුමට බැර කිරීම හැර වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

* 2026.03.31 දින ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය කරන ලද අතර ප්‍රත්‍යාගණන අතිරික්තය රු. 2000,000 ක් ගොඩනැගිලි ගිණුම හර කර වෙනත් වියදම් ගිණුම බැර කිරීම හැර මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

* දේපළ පිරියත උපකරණ සරළ මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.

(v) 2025.04.01 දින වගකීම් සහතික ප්‍රතිපාදනය ගිණුමේ ශේෂය රු. 500,000 ක් වෙනත් ගෙවිය යුතු දැ ලෙස සටහන් කර ඇත. 2026.03.31 දිනට වගකීම් සහතික ප්‍රතිපාදන රු. 300,000 වේ යැයි විශ්වාසී ලෙස ඇස්තමේන්තු කර ඇත. වර්ෂය තුළ ගෙවූ රු. 600,000 ක වගකීම් සහතික ප්‍රතිපාදන වියදම් මූල්‍ය වියදම් ලෙස ගිණුම්ගත කර ඇත.

(vi) 2026.03.31 දින සිටි ණයගැතියෙකු උන්මත්තක වී ඇති බව 2026.04.04 දින විශ්වාසනීය ලෙස සමාගමට දැනගන්නට ලැබිණි. ඔහුගෙන් අයවිය යුතු මුදල රු. 500 000 කි. මේ මුදලින් 40% ක් 2026.05.15 දින ඔහුගේ ඥාතියෙකු විසින් සමාගමට ගෙවන ලදී.

(vii) 2025.04.01 දින භාවිත අයිතිය සහිත මෝටර් රථය අත්පත් කරගෙන ඇති අතර 2026.03.31 දිනට භාවිත අයිතිය සහිත මෝටර් රථය සම්බන්ධව පහත දැක්වේ.

| | රු. 000 |
|---|---|
| පිරිවැය | 6,000 |
| සමු. ක්ෂය | (1,000) |
| ධාරණ අගය | 5,000 |

2025.04.01 දිනට කල්බදු වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ දැක්වේ. 2025/2026 හා 2026/2027 කල්බදු පොලී පිළිවෙළින් රු. 300,000 ක් හා රු. 230,000 ක් වේ. ගෙවූ කල්බදු වාරිකය රු. 1,000,000 ක් බෙදාහැරීමේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම හැර වෙනත් කිසිදු සටහනක් සිදුකර නොමැත.

(viii) 2026.01.01 දින රු. 1000,000 ක භාණ්ඩ විකිණීම හා වසරක සේවා සැපයීමට රු. 2,200,000 කට ගනුදෙනුකරුවකු සමග ගිවිසුමකට එළඹෙන ලදී. 2026.02.01 දින ගනුදෙනුකරු විසින් ගනුදෙනුවේ මුළු ප්‍රතිශ්ඨාව වන රු. 2,200,000 ගෙවූ අතර මුළු මුදල මුදල් ගිණුම හර කර විකුණුම් ගිණුම බැර කරන ලදී. 2026.03.01 දින සමාගම ගනුදෙනුකරුට භාණ්ඩ ප්‍රමාණය විකුණන ලදී. මේ පිළිබඳ වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(ix) වෙනත් ලැබිය යුතු දැ තුළ මාස 2කින් කල් ඉකුත් වන රු. 1000,000 ක ස්ථාවර තැන්පතුවක් අඩංගු වන අතර මුදල් හා මුදලට සමාන දැ තුළ රු. 1,500,000 ක මාස 6කින් කල් ඉකුත් වන භාණ්ඩාගාර බිල්පත් අඩංගු වේ.

(x) ගෙවූ ලාභාංශය රු. 200,000 පොදු සංචිත ගිණුමට හර කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලය රු. 1,000,000 ක යෝජිත ලාභාංශයක් ගෙවීමට යෝජනා කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

LKAS 01 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සුමොසදි පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව)

(1) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්න ආදායම් ප්‍රකාශය

(2) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(3) 2026.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (මුළු ලකුණු 40)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources
iexamhub

2. (අ) සිමිත වර්ණ පොදු සමාගම භාණ්ඩ අලෙවි කරනු ලබන සමාගමකි. 2026 මැයි මාසය සඳහා පිළියෙල කළ ගබඩා ලෙජරය පහත පරිදි වේ.

රු. 000

| දිනය | ලැබීම් | | | නිකුත් කිරීම් | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | ඒකකයක මිල | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම | ප්‍රමාණය | වටිනාකම |
| 05.01 | | | | | | 10 | 2,000 |
| 05.03 | 40 | 210 | 8,400 | | | 50 | 10,400 |
| 05.05 | | | | 40 | 300 | 10 | 2,100 |
| 05.15 | 50 | 220 | 11,000 | | | 60 | 13,100 |
| 05.25 | | | | 50 | 10,900 | 10 | 2,200 |
| 05.26 | 50 | 240 | 12,000 | | | 60 | 14,200 |
| 05.30 | | | | 40 | 9,400 | 20 | 4,800 |

**අමතර තොරතුරු**

(1) සමාගම තොග මිනුම් කිරීමේ ප්‍රතිපත්තිය භරිත සමාන්‍ය මිල ක්‍රමය (WAC) වේ. එහෙත් සමාගම ගබඩා ලෙජරය පිළියෙළ කර ඇත්තේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයටයි (FIFO)

(2) 2026.05.03 දින මිලදී ගැනීම් වල නිවැරදි ඒකක ප්‍රමාණය රු. 60,000 වේ.

(3) 2026.05.26 දින මිලදී ගත් ඒකකයක මිල රු. 250 ක් වේ.

(4) භාණ්ඩ විකුණුම් මිල රු. 280 කි.

**අවශ්‍ය වන්නේ,**

(1) 2026.05.31 දිනෙන් අවසන් මාසය සඳහා නිවැරදි ගබඩා ලෙජරය

(2) 2026 මායි මාසය සඳහා දළ ලාභය (ලකුණු 08)

(ආ) සීමිත සරණ සමාගම භාණ්ඩ නිෂ්පාදන සමාගමකි. මසකට අමුද්‍රව්‍ය ඒකක 2,000 ක් අවශ්‍ය වන අතර අමුද්‍රව්‍ය ඒකකයක ගැනුම් මිල රු. 60 කි. මෙම අමුද්‍රව්‍ය ඒකකයක් වාර්ෂිකව රඳවා ගැනීමේ පිරිවැය එහි ගැණුම් මිලෙන් 10% කි. ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඒකක 4,000 කි. භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීමට අමුද්‍රව්‍ය ඒකක 10 ක් අවශ්‍ය වේ. මාසයක් තුළ නිෂ්පාදනය කරන ඒකක ප්‍රමාණය 500 සිට 1,500 දක්වා විචලනය වේ. සාමාන්‍ය ඇණවුම් කාලය මාස 04 ක් වන අතර උපරිම ඇණවුම් කාලය මාස 5 කි.

**අවශ්‍ය වන්නේ,**

(1) ඇණවුමක පිරිවැය

(2) සාමාන්‍ය තොග මට්ටම (ලකුණු 06)

(ඉ) සීමිත සිංහ පොදු සමාගම විදුලි පංකා නිෂ්පාදනය කරනු ලබන සමාගමකි. මෙම සමාගම සැකසුම් හා නිමැවුම් නම් වන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් හා ගබඩාව නම් වූ සේවා දෙපාර්තමේන්තුවකින් සමන්විත වේ. සමාගමේ අපේක්ෂිත ක්‍රියාකිරී මට්ටම විදුලි පංකා 10,000 කි.

සැකසුම් දෙපාර්තමේන්තුවේ හා නිමැවුම් දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය පිරිවැය අන්තග්‍රර්හණ අනුපාත පිළිවෙලින් සෘජු ශ්‍රම පැය පදනම හා යන්ත්‍ර පැය පදනම වේ.

පහත පරිදි සමාගමේ පුහුණුවන ගිණුම් ලිපිකරුවකු විසින් පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත දැනටමත් ගණනය කර ඇත.

| | | සැකසුම් | නිමැවුම් |
|---|---|---|---|
| භාවිත කළ අන්තර්ග්‍රහණ අනුපාතය | | සෘජු ශ්‍රම පැය | යන්ත්‍ර පැය |
| විදුලි පංකාවකට පොදු කායර්ය පිරිවැය | | රු. 400 | රු. 300 |
| අයවැයගත සෘජු ශ්‍රම පැය | | 40,000 | 30,000 |
| අයවැයගත යන්ත්‍ර පැය | | 14,000 | 30,000 |
| ඒකක යන්ත්‍ර පැය | සත්‍ය | 05 | 04 |
| | අයවැයගත | 04 | 08 |
| සෘජු ශ්‍රම පැය | සත්‍ය | 05 | 06 |
| | අයවැයගත | 06 | 05 |



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

ඉහත පොදු කාර්යය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව පිළියෙළ කිරීමේදි පහත අඩුපාඩු හා වැරදි සිදු වී ඇති බව සමාගමේ කළමණාකරු විසින් අනාවරණය කර ගන්නා ලදි.

i වාර්ෂිකව යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට 15% බැගින් ක්ෂය කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. එහෙත් 5% බැගින් ක්ෂය කර තිබේ.

ii පරිපාලන ගොඩනැගිලි ක්ෂය රු. 600,000ක් ගොඩනැගිලි බිම් ප්‍රමාණය පදනම් කරගනිමින් විභජනය කර තිබේ.

iii සමාගමේ මුළු විදුලි වියදම් රු. 1200,000 ක් බිම් ප්‍රමාණය පදනම් කරගනිමින් කම්හලට විභජනය කර ඇත. කම්හල් විදුලි වියදම් මුළු විදුලි වියදමින් 2/3 වේ.

iv ගබඩා භාරකරුගේ වැටුප රු. 250,000 ක් අලෙවි කළමණාකරුගේ වැටුප ලෙස ගිණුම්ගත කර තිබුණි.

v අලෙවි කළමණාකරුගේ වැටුප රු. 500,000 ක් නිෂ්පාදන කළමණාකරුවන්ගේ වැටුප් ලෙස සටහන් කර ඇත. නිෂ්පාදන කළමණාකරුවන්ගේ වැටුප රු. 1000,000 ක් පරිපාලන වියදම් ලෙස ගිණුම්ගත කර ඇත.

vi කම්හල් වරිපනම් රු. 600,000 හා යන්ත්‍ර රක්ෂණය රු. 700,000 පිළිබඳ ගිණුම්ගත කර නොමැත.

vii විභජනය කළ ගබඩා මුළු පොදුකාර්යය පිරිවැය රු. 800,000 නිෂ්පාදන දෙපාර්තමේන්තුව අතර ද්‍රව්‍ය පාරිභොජනය කළ ඒකක ප්‍රමාණය පදනම් කර ගෙන බෙදා හැර ඇත.

අමතර තොරතුරු,

(01) පහත තොරතුරු පොදු කාර්යය පිරිවැය හා නැවත විභජන පදනම් වලට අදාළ වේ.

| | සැකසුම් | නිමැවුම් | ගබඩා |
|---|---|---|---|
| යන්ත්‍ර පිරිවැය (රු. 000) | 2,000 | 1,000 | 500 |
| බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | 1,500 | 1,000 | 500 |
| විදුලි පරිභෝජනය (කිලෝවොට්) | 4,000 | 2,000 | 2,000 |
| නිෂ්පාදන කළමණාකරුවන් ගණන | 3 | 2 | |
| ද්‍රව්‍ය පරිභොජන ප්‍රමාණය | 6,000 | 2,000 | |
| ද්‍රව්‍ය අධියාචනා පත්‍ර | 700 | 500 | |

(02) සේවා අංශයේ පොදු කාර්යය පිරිවැය නැවත විභජනය කිරීමේ නිවැරදි පදනම ද්‍රව්‍ය අධියාචනා පත් ගණන වේ.

(03) විදුලි පංකාවක් නිෂ්පාදනය කිරිමට අදාළ අනෙකුත් පිරිවැය තොරතුරු

සෘජු ද්‍රව්‍ය පිරිවැය ---------------------------------------- 3,000

සෘජු ශ්‍රම පිරිවැය ---------------------------------------- 2,000

වෙනත් සෘජු වියදම් ---------------------------------------- 120

ලාභය නිෂ්පාදන පිරිවැයෙන් ---------------------------------------- $33\frac{1}{3}\%$

(04) නිෂ්පාදන නොවන පොදුකාර්යය පිරිවැය - විචල්‍ය ඒකකයකට රු.100
ස්ථාවර රු. 160,0000

**අවශ්‍ය වන්නේ,**

(1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් සංශෝධිත පොදුකාර්යය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) සැකසුම් හා නිමැවුම් අංශ සඳහා සංශෝධිත පොදුකාර්යය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත

(3) විදුලි පංකාවකට අදාළ අදාළ නිෂ්පාදන පිරිවැය හා විකුණුම් මිල

(4) පිරිවැය මුලිකාංග පැහැදිලිව දක්වමින් අපේක්ෂිත ආදායම් ප්‍රකාශය

(ලකුණු 26)
(මුළු ලකුණු 40)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

3. (අ) සීමා සහිත වර්තන සමාගම VAT ලියාපදිංචි වී ඇති සමාගමකි. 2025.04.01 දින ආරම්භක වත්කම්, වගකීම්, හිමිකම් හා 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කළ ගනුදෙනු හා සිදුවීම් වල ද්විත්ව බලපෑම පහත වගුවේ දැක්වේ.

රු. මිලියන

| | වත්කම් | | | | | වගකීම් | | | | හිමිකම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ පිරියත උපකරණ | තොග | වෙළඳ ලැබිය යුතු දෑ | වෙනත් ලැබිය යුතු දෑ | මුදල් හා මුදලට සමාන දෑ | බැංකු ණය | වෙළඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ගෙවිය යුතු VAT | ප්‍රකාශිත ප්‍රාග්ධනය සා/කො | ප්‍රත්‍යාගනන සංචිත | පොදු සංචිත | රඳවාගත් ඉපැයුම් |
| | 5000 | 400 | 600 | 50 | 450 | 1000 | 500 | 60 | 140 | 3000 | 1000 | 300 | 500 |
| 1 | | -250 | | | +354 | | | | +54 | | | | +50 |
| 2 | | +400 | | | -472 | | | | -72 | | | | |
| 3 | | | -500 | | +450 | | | | | | | | -50 |
| 4 | -100 | | | | | | | | | | -100 | | |
| 5 | | | | -50 | | | | | | | | | -50 |
| 6 | | | | | -360 | | -400 | | | | | | +40 |
| 7 | | | | | | | | -60 | | | | | +60 |
| 8 | | | | | +1000 | | | | | +1000 | | | |
| 9 | | | | | -20 | | | | -20 | | | | |
| 10 | | -300 | +590 | | | | | | +90 | | | | +200 |
| 11 | | | | | -150 | -120 | | | | | | | -30 |
| 12 | | | | +10 | +40 | | | | | | | | +50 |
| 13 | | +200 | | | | | +236 | | -36 | | | | |
| 14 | | | | | -60 | | | +30 | | | | | -90 |
| 15 | | | | | | | | | | +200 | -200 | | |
| 16 | | | | | | | | | | | | +50 | -50 |
| 17 | | | | | -15 | | | | | | | | -15 |
| | 5,100 | 450 | 690 | 10 | 1,217 | 880 | 336 | 30 | 156 | 4,200 | 700 | 350 | 615 |

අතිරේක තොරතුරු

* වර්ෂයට අදාළ මෙහෙයුම් වියදම් සමාගම විසින් මුදලින් දරා නොමැත.

**අවශ්‍ය වන්නේ,**

(1) ඉහත ගනුදෙනු හා සිද්ධි අංක 01 සිට 17 දක්වා ඇති වටිනාකම් තුළින් නිරූපණය කෙරෙන ගනුදෙනු හා සිද්ධි වටිනාකම සමග ලිවීම.

(2) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ කාලච්ඡේදයේ ලාභය (ලකුණු 25)

(ආ) අමසර ක්‍රීඩා සමාජයේ 2025.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය පහත දැක්වේ.

| | රු. 000 |
|---|---|
| වත්කම් | |
| දේපළ පිරියත උපකරණ (ධාරණ අගය) | 3,000 |
| ඉදිරියට කළ වට්පනම් | 20 |
| හිඟහිටි සාමාජික මුදල් | 180 |
| මුදල් | 400 |
| | 3,600 |
| හිමිකම හා වගකීම් | |
| සමුච්චිත අරමුදල | 2,100 |
| + අතිරික්තය | 200 |
| | 2,300 |
| යාවජීව සාමාජික මුදල් | 500 |
| ගොඩනැගිලි අරමුදල් | 400 |
| මෝටර් රථ පරිත්‍යාග | 300 |
| අයිතිකරුගේ හිමිකම | 3,500 |
| කලින් ලද සාමාජික මුදල් | 60 |
| ගෙවිය යුතු විදුලිය | 40 |
| | 3,600 |



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී පහත ගනුදෙනු හා සිද්ධි සිදු විය.

(i) 2025.04.01 දින සාමාජිකයින් 100 දෙනෙකු සිටි අතර මෙයින් 10 දෙනෙකු යාවජීව සාමාජිකයෝ වෙති. මාසික සාමාජික ගාස්තු රු. 1,000කි. යාවජීව සාමාජිකත්වය ලබා ගැනීමේදී වාර්ෂික සාමාජික මුදලින් රු. 2,000ක සාමාජික මුදල් වට්ටමක් ලබා දීම සංගමයේ ප්‍රතිපත්තියයි. 2025.04.01 දින සාමාජිකයින් 25 දෙනෙකු බැඳුණු අතර ඒයින් යාවජීව සාමාජිකයින් 5 දෙනෙකු වේ. යාවජීව සාමාජිකයෙකු වසර 10 සඳහා සාමාජික මුදල් ගෙවිය යුතුවේ.

(ii) නව සාමාජිකයෙකු ඇතුළත්වීමේදී ඇතුළත්වීමේ ගාස්තු රු. 8,000 ක් ගෙවිය යුතු වේ.

(iii) සාමාජිකයින් යාවජීව සාමාජිකයින් හැර 80 දෙනෙකුගෙන් වාර්ෂික සාමාජික මුදල්ද, සාමාජිකයින් 6 දෙනෙකුගෙන් වසර 2 ක් සඳහා සාමාජික මුදල් ලැබුණි. හිඟහිටි සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සාමාජික මුදල් නොලද අතර ඒම සාමාජිකයින් සංගමයෙන් ඉවත් කෙරිනි. පෙර වර්ෂයේ ඉවත් කළ සාමාජිකයින් 10 දෙනෙකු පෙර වර්ෂය හා මෙම වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවන ලදී.

(iv) වර්ෂය තුළ ගොඩනැගිලි අරමුදලට ලද මුදල රු. 2,000,000 වන අතර 2025.10.01 දින රු. 2,100,000 වැය කර ගොඩනැගිලි ඉදිකර අවසන් කරන ලදී.

(v) මෝටර් රථ පරිත්‍යාග ගිණුමේ ශේෂයෙන් නිරූපනය වන්නේ 2023.04.01 දින සංගමයට ලැබුණු මෝටර් රථ පරිත්‍යාගයෙකි. මෙම පරිත්‍යාග සම්පූර්ණ වසර 7 ක් තුළ ආදායම් ලෙස හඳුනා ගැනීම සංගමයේ ප්‍රතිපත්තියයි.

(vi) දේපළ පිරියත උපකරණ තුළ රු. 1,000,000 ක ක්‍රීඩා පිටියක් අඩංගු වන අතර දේපළ පිරියත උපකරණ හීනවන ශේෂ ක්‍රමයට 20% බැගින් ක්ෂය කිරීම සංගමයේ ප්‍රතිපත්තියයි.

(vii) 2025.04.01 දින දිළිඳු දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම සඳහා අරමුදලක් ඇති කරන ලදී. මෙම අරමුදලට ලද මුදල රු. 800,000 වන අතර දිළිඳු දරුවන්ට රු. 700,000 ක් ශිෂ්‍යත්ව අරමුදලින් 2026.03.31 වන විට ලබා දී ඇත.

(viii) වර්ෂය තුළ මෙහෙයුම් වියදම් මුදලින් ගෙවීම් රු. 360,000 කි.

**අවශ්‍ය වන්නේ,**

(1) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ

(i) සාමාජික මුදල් ගිණුම
(ii) යාවජීව සාමාජික මුදල් ගිණුම
(iii) ගොඩනැගිලි අරමුදල් ගිණුම
(iv) ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම
(v) මෝටර් රථ පරිත්‍යාග ගිණුම

(2) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

(3) 2026.03.31 දින සංගමයේ සමුච්චිත අරමුල. (ලකුණු 15)

(මුළු ලකුණු 40)

4. (අ) ලක්ෂාන්ගේ ව්‍යාපාරයේ VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාර වන අතර VAT අනුපාතය 18% කි. 2026 මැයි මාසයේ සිදුවූ ගණුදෙනු හා සිද්ධීන් පහත දැක්වේ.

2026.05.01 ලක්ෂාන් විසින් රු. 1,500,000 ක මුදලක්, රු. 1,000,000 ක ඉඩම හා ගොඩනැගිලි ද ව්‍යාපාරයට ආයෝජනය කරන ලදී.

2026.05.01 අත්පිට භාණ්ඩ ගැණුම් VAT රහිත රු. 800,000 කි.

2026.05.02 පිරිවැය රු. 600,000 වූ භාණ්ඩ තොගයක් VAT සහිත රු. 944,000 කට අත්පිට විකිණීම.

2026.05.03 බැංකු ණය මුදල් ලබා ගැනීම රු. 500,000

2026.05.05 පහත සඳහන් පුද්ගලයන්ගෙන් භාණ්ඩ ණයට ගැනීම.

- අමල්ගෙන් VAT සහිත භාණ්ඩ ගැනීම රු. 826,000
- කමල්ගෙන් VAT රහිත භාණ්ඩ ගැනීම රු. 500,000

2026.05.10 පහත සඳහන් පුද්ගලයන්ට ණයට භාණ්ඩ විකිණීම.

- පිරිවැය රු. 300,000 වූ භාණ්ඩ VAT රහිත රු. 500,000 කට සම්පත්ට විකිණීම.
- පිරිවැය රු. 400,000 වූ භාණ්ඩ VAT සහිත රු. 826,000 කට සාගරට විකිණීම.

2026.05.12 ලද ගෙවල් කුලී රු. 200,000 යි.

2026.05.14 අමල් මුදල් ගෙවීම රු. 450,000 යි. ලද වට්ටම 10% යි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

| | |
|---|---|
| 2026.05.18 | සම්පත්ගෙන් රු. 400,000ක් පියවීම සඳහා ලද මුදල් රු. 380,000 යි. |
| 2026.05.20 | ව්‍යාපාරය දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවූ VAT රු. 110,000 යි. |
| 2026.05.22 | කමල්ගේ ණයහිමි ශේෂය රු. 100,000 ක් සාගරගේ ණය ගැති ශේෂයට හිලව් කිරීම. |
| 2026.05.25 | අමල් හා කමල්ගෙන් ණයට ගත් භාණ්ඩ වලින් 10% ක් ආපසු යවන ලදී. |
| 2026.05.28 | සම්පත්ට හා සාගරට විකුණූ භාණ්ඩ වලින් 20% ක් ආපසු එවන ලදී. |
| 2026.05.30 | විදුලි වියදම් ගෙවීම රු. 60,000 යි. |
| 2026.05.31 | බැංකු ණය වාරිකය ගෙවීම රු. 120,000 යි. මෙම වටිනාකම තුළ ඇතුළත් රු. 90,000 ක් බැංකු ණය වේ. |

* ගොඩනැගිලිවල පිරිවැය 650,000 වන සුන්බුන් අගය රු. 50,000 කි. එහි ඵලදායී ජීව කාලය වසර 5 කි.

**අවශ්‍ය වන්නේ,**

(1) 2026 මැයි මාසය සඳහා පහත මූලික සටහන් පොත්,

(i) මුදල් ලැබීම් ජ' නලය
(ii) මුදල් ගෙවීම් ජ' නලය
(iii) ගැනුම් ජ' නලය
(iv) විකුණුම් ජ' නලය
(v) ආපසු යැවුම් ජ' නලය
(vi) ආපසු එවුම් ජ' නලය
(vii) පොදු ජ' නලය

(2) 2026 මැයි මස පොදු ලෙජරයේ පහත ලෙජර ගිණුම්,

(i) මුදල් ගිණුම
(ii) VAT පාලන ගිණුම
(iii) වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම
(iv) වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුම
(v) බැංකු ගිණුම

(3) 2026 මැයි මාසය සඳහා දළ ලාභය හා ශුද්ධ ලාභය (ලකුණු 27)

(ඇ) සීමිත අමිල පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

(1) **ආදායම් ප්‍රකාශයෙන් උපුටාගත් තොරතුරු**

| | රු. 000 |
|---|---|
| දළ ලාභය | 4,000 |
| වෙනත් ආදායම් | 200 |
| මෙහෙයුම් වියදම් | 2,100 |
| පොලී වියදම් | 100 |
| ආදායම් බදු ගෙවීම් | 400 |

(2) **මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් උපුටා ගත් තොරතුරු**

| | 2026.03.31<br>රු. 000 | 2025.03.31<br>රු.000 |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | 6,100 | 5,000 |
| අවසන් තොගය | 1,200 | 800 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 700 | 900 |
| මුදල් හා මුදල් සමාන දෑ | 500 | 400 |
| මුළු වත්කම් | 8,500 | 7,000 |
| සංචිත-පොදු සංචිත | 300 | 100 |
| -රඳවාගත් ඉපැයුම් | 1,000 | 300 |
| බැංකු ණය | 2,000 | 1,000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 1,200 | 500 |
| ආදායම් බදු ප්‍රතිපාදන | 300 | 200 |
| වැඩ කරන දින ගණන | | 360 |

(3) අනෙකුත් තොරතුරු

දළ ලාභ අනුපාතය 40%
සාමාන්‍ය කොටස් ප්‍රතිෂ්ඨාව රු. 37
සියලු විකුණුම් ණය පදනමට වේ.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

(4) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කරන ලද අනුපාත

| | |
|---|---|
| තොග රැඳවුම් දින ගණන ---------- | දින 32 |
| වෙළඳ ලැබිය යුතු දෑ එකතු කිරීමේ කාලය ---------- | දින 25 |
| හිමිකම් ප්‍රතිලාභ අනුපාතය ---------- | 26% |
| ශුද්ධ ලාභ අනුපාතය ---------- | 14% |
| ණය අනුපාතය ---------- | 12% |
| කොටසක ලාභාංශ ---------- | රු. 8.00 |
| පොලී ආවරණ අනුපාතය ---------- | වාර 8 |
| කොටසක ඉපැයුම ---------- | රු. 1 4 |

**අවශ්‍ය වන්නේ,**

(1) 2026.03.31 දිනෙන් අවසන් වෂර්ය සඳහා පහත අනුපාත ගණනය කිරීම.

(i) තොග රැඳවුම් කාලය
(ii) වෙළඳ ලැබිය යුතු දෑ එකතු කිරීමේ කාලය
(iii) ශුද්ධ ලාභ අනුපාතය
(iv) හිමිකම් ප්‍රතිලාභ අනුපාතය
(v) පොලී ආවරණ අනුපාතය
(vi) කොටසක ලාභාංශ
(vii) කොටසක ඉපැයුම
(viii) ණය අනුපාතය

(2) 2025.03.31 අවසන් වර්ෂ හා 2026.03.31 දිනෙන් අවසන් වර්ෂවල අනුපාත වර්ධනය වී ඇත්ද පිරිහී ඇත්ද යන වග දක්වන්න. (ලකුණු 13)

(මුළු ලකුණු 40)

5. (අ) අමර, සමර, චාමර හවුල් ව්‍යාපාරයේ 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත දැක්වේ.

රු. 000

| | | පිරිවැය | සමුක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපළ පිරියත උපකරණ | | 10,000 | 2,000 | 8,000 |
| ජංගම වත්කම් | | | | |
| අවසන් තොගය | | | 800 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | | | 900 | |
| ඉදිරියට කළ පරිපාලන වියදම් | | | 100 | |
| මුදල් | | | 200 | 2,000 |
| | | | | 10,000 |
| හිමිකම් හා වගකීම් | | | | |
| ප්‍රාග්ධන ගිණුම | අමර | | 4,000 | |
| | සමර | | 2,000 | |
| | චාමර | | 2,000 | 8,000 |
| ජංගම ගිණුම් | අමර | | (200) | |
| | සමර | | 300 | |
| | චාමර | | 100 | 200 |
| අයිතිකරුවන්ගේ හිමිකම | | | | 8,200 |
| ජංගම නොවන වගකීම් | | | | |
| ණය ගිණුම - අමර | | | 800 | 800 |
| ජංගම වගකීම් | | | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | | 850 | |
| ගෙවිය යුතු පරිපාලන වියදම් | | | 150 | 1,000 |
| | | | | 10,000 |

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී පහත ගනුදෙනු ගැලපිය යුතුය.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(1) අමර, සමර, චාමර හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුම පහත පරිදි වේ.

* ලාභ ලාභ බෙදා ගැනීමේ අනුපාතය ප්‍රාග්ධන ගිණුම් වල ශේෂ වලට සමානුපාතික වේ.
* හවුල් වේතන මාසිකව අමර, සමර හා චාමර පිළිවෙලින් රු. 30,000, රු. 20,000 හා රු.10,000 වේ.
* ප්‍රාග්ධන පොලී අනුපාතය 10% කි.
* ණය සඳහා පොලී අනුපාතය 10% කි.

(2) අමරගේ ණය මුදලින් 50% ක් 2025.10.01 දිනට පොළියත් සමග ගෙවා දමන ලදි.

(3) වර්ෂය තුළ ණයගැතියන්ගෙන් ලද මුදල රු. 10,400,000 වන අතර දුන් වට්ටම 800,000 කි. වෙළඳ ලැබිය යුතු හානි කර අලාභ රු. 400,000 වන අතර අන්තර් ලෙජර් මාරු කිරීම් රු. 800,000 කි.

(4) දළ ලාභ අනුපාතය 25%

(5) අවසාන තොගය වැඩිවීම රු. 200,000 ක් වන අතර වෙළඳ ලැබිය යුතු දෑ අඩු වීම රු. 100,000 කි.

(6) හවුල්කරුවන් විසින් භාණ්ඩ ගැනිලි අමර, සමර හා චාමර පිළිවෙළින් රු. 300,000, රු. 200,000 හා රු. 100,000 වේ.

(7) ණය හිමියන්ගෙන් ලද වට්ටම රු. 150,000 වන අතර ආපසු යැවුම් රු. 200,000 කි. 2026.03.31 දිනට වෙළඳ ගෙවිය යුතු දෑ ශේෂය වැඩි වීම රු. 50,000 කි.

(8) ව්‍යාපාරයේ මෝටර් රථය 2025.04.01 දින සිට චාමරට කුලී පදනම මත ලබා දී ඇති අතර වාර්ෂික කුලී රු. 150,000 ක් පිළිබඳ ව ගිණුම් ගත කර නොමැත.

(9) 2026.03.31 දින රු. 300,000 ක් තොග හානි වී ඇති අතර රක්ෂණ සමාගම 2/3 වන්දි සමරට ගෙවා ඇත. මේ පිළිබඳ ගිණුම්ගත කර නොමැති අතර ප්‍රාග්ධන ගිණුම් මගින් ගැලපීමට එකග වී ඇත.

(10) දේපළ පිරියත උපකරණ තුල ඉඩම් රු. 3,000,000 අඩංගු වේ. දේපළ පිරියත උපකරණ සරල මාර්ග ක්ෂය ක්‍රමය යටතේ 5% බැගින් ක්ෂය කරනු ලබයි. මෙම වත්කම් පරිපාලන කටයුතු සඳහා භාවිතා කරයි.

(11) වර්ෂය තුළ පරිපාලන වියදම් ගෙවීම රු. 520,000.

(12) 2026.03.31 දිනට හවුල් ව්‍යාපාරයෙන් අමර විශ්‍රාම ගත් අතර එදින ඔහුගේ සහෝදරයෙකු වන කමර නව හවුල් කරුවෙකු වශයෙන් බඳවා ගන්නා ලදි. එදිනට අමරගේ කීර්තිනාමට කොටස රු. 300,000 විය. පිරිවැය රු. 2000,000 වූ එදිනට ධාරණ අගය රු. 1,800,000 ක මෝටර් රථය ධාරණ අගයට පවරා ගැනීමට අමරට ඉඩ හරින ලදි. ඉතිරි මුදල කමර ගෙවීමට එකග විය. එම මුදල කමරගේ ප්‍රාග්ධනය ලෙස සැලකීමට හවුල්කරුවන් එකග විය.

(13) වර්ෂය තුළ බැංකුවට ඉදිරිපත් වූ නිකුත් කළ චෙක්පත් වල වටිනාකම රු. 10,200,000 වන අතර තැන්පත් කළ බැංකුවට ඉදිරිපත් වූ චෙක්පත් වල වටිනාකම රු. 9,900,000 වේ.

**අවශ්‍ය වන්නේ,**

(1) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(2) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම

(3) 2026.03.31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය

(4) 2026.03.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලකුණු 30)

(ආ) සාගරගේ ව්‍යාපාරය VAT ලියාපදිංචි නිෂ්පාදන ව්‍යාපාරයක් වන අතර පැරණි නිෂ්පාදන යන්ත්‍රය විකුණා නව නිෂ්පාදන යන්ත්‍ර මිලදී ගැනීම සලකා බලමින් සිටියි. නව යන්ත්‍රය වසර 4 භාවිතා කිරීම අපේක්ෂිත වන අතර ඇස්තමේන්තුගත තොරතුරු පහත දැක්වේ.

| | රු. 000 |
|---|---|
| නව යන්ත්‍ර ගැනුම් මිල | 5,000 |
| සවිකිරිමේදී හා ස්ථානගත කිරීමේ වියදම් | 1,000 |
| පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල | 1,600 |
| පැරණි යන්ත්‍රය ගලවා ඉවත් කිරීමේ පිරිවැය | 400 |
| නව යන්ත්‍රය ඵලදායි ජීවකාලය අවසානයේ විකුණුම් මිල | 1,200 |
| පැරණි යන්ත්‍රයේ ධාරණ අගය | 800 |
| යන්ත්‍රය සඳහා අය කළ VAT | 2,000 |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

අතිරේක තොරතුරු,

(1) කාරක ප්‍රාග්ධනය රු. 500,000 සිට රු. 800,000 දක්වා වැඩි වේ.

(2) ව්‍යාපාරයේ ගිණුම් සහයක විසින් ගණනය කළ බදු පසු ලාභය පහත පරිදි වේ.

රු. 000

| වර්ෂය | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| බදු පසු ලාභය | 800 | 1 200 | 2 000 | 800 |

(3) ගිණුම් සහයක විසින් බදු පසු ලාභය ගණනය කිරීමේදී පහත වැරදි හා අඩුපාඩු සිදු වී ඇති බව පසුව ගණකාධිකාරී විසින් සොයා ගන්නා ලදි.

* වාර්ෂික ක්ෂය වීම රු. 1,600,000 ලෙස ගිණුම්ගත කර ඇත.
* වාර්ෂිකව ස්ථාවර පිරිවැයෙහි වැඩි වීම රු. 500,000 පිළිබඳව ගිණුම්ගත කර නොමැත.
* වාර්ෂික ශ්‍රම පිරිවැය අඩු වීම රු. 100,000 ක් වැඩි වීමක් ලෙස ගිණුම් ගත කර ඇත.
* වාර්ෂික ආදායම් බදු අනුපාතය 20%
* වාර්ෂික විකුණුම් තුළ අඩංගු VAT රු. 300,000 යි.

(4) ආයෝජන අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% වන අතර එහි වට්ටම් සාධකය පහත පරිදි වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.9 | 0.8 | 0.7 | 0.6 |

**අවශ්‍ය වන්නේ,**

(1) ව්‍යාපෘතියේ අපේක්ෂිත මූලික ආයෝජනය හා වාර්ෂික ශුද්ධ මුදල් ප්‍රවාහය නිවැරදි කිරීමේ ප්‍රකාශය

(2) ව්‍යාපෘතියේ ශුද්ධ මුදල් ප්‍රවාහය (NPV)

(3) පිළිගෙවුම් කාලය

(4) ආයෝජන ප්‍රතිලාභ අනුපාතය (ලකුණු 10) (මුළු ලකුණු 40)

6. (අ) සීමිත පාරමී පොදු සමාගම 2026.03.31 දිනට හා 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් උපුටා ගත් තොරතුරු පහත දැක්වේ.

| | | 2026.03.31 | | 2025.03.31 |
|---|---|---|---|---|
| | | රු. 000 | | රු. 000 |
| දේපල පිරියත උපකරණ පිරිවැය | | 21 900 | | 25 000 |
| සමුක්ෂය | | 3 000 | | 5 000 |
| ආයෝජන | | 1 500 | | 1 000 |
| තොගය | | 1 200 | | 1 600 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 800 | | 700 | |
| වෙළඳ ලැබිය යුතු දෑ හානිකර අලාභ ඉඩ හැරීම් | (80) | 720 | (140) | 560 |
| ලැබිය යුතු ආයෝජන පොලී | | 80 | | 100 |
| මුදල් | | 10 560 | | 3 200 |
| ප්‍රත්‍යාගණන සංචිත (ගොඩනැගිලි) | | | | 400 |
| පොදු සංචිත | | 2 500 | | 1 500 |
| රඳවා ගත් ඉපැයුම් | | 1 500 | | 1 000 |
| කල්බදු වගකීම | | 1 400 | | 1 800 |
| බැංකු ණය | | 8 000 | | 7 000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 800 | | 1 000 |
| ආදායම් බදු ප්‍රතිපාදන | | 150 | | 200 |
| ගෙවිය යුතු පොලී | | 100 | | 200 |
| ගෙවිය යුතු විදුලිය | | 150 | | 100 |
| බැංකු අයිරාව | | 500 | | 400 |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

අතිරේක තොරතුරු,

1) 2024.04.01 මිලදී ගත් රු. 8 000,000 යන්ත්‍ර 2025.10.01 දින විකුණා ඇති අතර යන්ත්‍ර 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

2) 2026.03.31 ගොඩනැගිලි දෙවන වර ප්‍රත්‍යාගණන කළ ඇති අතර ප්‍රත්‍යාගණන ඌනතාවය රු.500,000 යි. එදිනට සමුච්ත ක්ෂය රු. 600,000 කි. මොටර් රථ වර්ෂය තුළ මිලදී ගෙන ඇත.

3) ආදායම් ප්‍රකාශයෙන් උපුටා ගැනීම.

| | රු. ‘000 |
|---|---|
| යන්ත්‍ර විකිණීමේ අලාභය | 600 |
| ආයෝජන පොලී | 300 |
| ආදායම් බදු | 400 |
| පොලී වියදම් | 380 |

4) වර්ෂය තුළ ප්‍රකාශිත සාමාන්‍ය කොටස් වල වැඩි වීම රු. 5,000,000 වේ. වර්ෂය තුළ සංචිත ප්‍රාග්ධනිත කිරීම රු. 1,200,000 වන අතර අතුරු ලාභාංශ ගෙවීම රු. 400,000 කි.

5) බැංකු ණය වාරිකය ගෙවීම රු. 1,000,000 වේ. කල්බදු පොලී රු. 180,000 කි.

**අවශ්‍ය වන්නේ,**

(1) LKAS – 7 මුදල් ප්‍රවාහය ප්‍රකාශන ප්‍රමිතියට අනුව 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (ලකුණු 20)

ආ) සීමා සහිත අරුන්දනී පොදු සමාගම විදුලිය අඩුවෙන් වැය වන විදුලි බල්බයක් නිෂ්පාදනය කොට අලෙවි කිරීමට සැලසුම් කරමින් සිටියි. ගිණුම් සහයක විසින් පහත තොරතුරු සපයා ඇත.

* ඇස්තුමේන්තුගත ස්ථාවර පිරිවැය රු. 300,000 යි.
* විදුලි බල්බයක දායකය රු. 800 යි.
* ඇස්තමේන්තුගත නිෂ්පාදන හා අලෙවි ඒකක ප්‍රමාණය 600 යි.
* දායක විකුණුම් අනුපාතය 40%

එහෙත් නිෂ්පාදන හා අලෙවි කළමණාකරු පහත වැරදි , අඩුපාඩු හා යෝජනා ඉදිරිපත් කර ඇත.

* ඒකකයක් නිෂ්පාදනය කිරීමට වැයවන සෘජු ශ්‍රම පිරිවැය රු. 400 පිළිබඳව සැලකිල්ලට ගෙන නොමැත.
* රජය විසින් රු. 100,000 නිෂ්පාදන පිරිවැයක් දැරීමට එකග වී ඇති අතර එම පිරිවැය ස්ථාවර පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබීම.
* ඒකක විකුණුම් මිල රු. 500 කින් වැඩි කිරීමට යෝජනා කිරීම
* නව බල්බය හදුන්වා දීම සඳහා රු. 200,000 ප්‍රචාරණ වියදමක් දැරීමට යෝජනා කිරීම.
* යන්ත්‍ර ක්ෂය රු. 150,000 ක වියදමක් රු. 100,000 ක් ලෙස සැලකිල්ලට ගෙන තිබීම.

**අවශ්‍ය වන්නේ,**

ඉහත වැරදි අඩුපාඩු හා යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් පසු පහත දෑ ගණනය කරන්න.

(1) නිවැරදි ස්ථාවර පිරිවැය

(2) ඒකක විකුණුම් මිල හා ඒකක දායකය

(3) මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා අලෙවි කළ යුතු විදුලි බල්බ ප්‍රමාණය

(4) සමාගම වර්ෂය තුළ අපේක්ෂිත ලාභය හෝ අලාභය

(5) රු. 270 000 ලාභයක් ලැබීමට අලෙවි කළ යුතු විදුලි බල්බ ප්‍රමාණය

(6) ඒකකයක නිෂ්පාදන පිරිවැය 25% කින් අඩු කිරීමටත් ඒකක විකුණුම් මිල 20% කින් අඩු කිරීමටත් ස්ථාවර පිරිවැය රු. 160,000 කින් වැඩි කිරීමටත් යෝජනා කරයි නම්,

(i) නව ඒකකයක විකුණුම් මිල

(ii) ඒකකයක නව විචල්‍ය පිරිවැය

(iii) අපේක්ෂිත ලාභය ලබා ගැනීමට අලෙවි කළ යුතු විදුලි බල්බ ප්‍රමාණය

(ලකුණු 20)
(මුළු ලකුණු 40)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

# බස්නාහිර පළාත් - තෙවන වාර පරීක්ෂණය - 2026

# ගිණුම්කරණය - I

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| (1) | 2 | (16) | 4 |
| (2) | 3 | (17) | 5 |
| (3) | 4 | (18) | 2 |
| (4) | 3 | (19) | 3 |
| (5) | 5 | (20) | 2 |
| (6) | 1 | (21) | 4 |
| (7) | 4 | (22) | 2 |
| (8) | 2 | (23) | 5 |
| (9) | 3 | (24) | 1 |
| (10) | 2 | (25) | 2 |
| (11) | 5 | (26) | 3 |
| (12) | 4 | (27) | 1 |
| (13) | 3 | (28) | 4 |
| (14) | 3 | (29) | 4 |
| (15) | 1 | (30) | 2 |

**(ලකුණු 30 x 4 = 120)**

(31) 1 - B **(1)** 2 - A **(1)**
3 - C **(1)** 4 - D **(1)**

**(32)** 3555 (රු'000) **(4)**

(33) (රු'000)
A - අඩු වේ. **(1)** 150 **(1)**
B - වැඩිවේ **(1)** 1707 **(1)**

(34) (රු'000)

3. වෙ/ලැ/යුතු දෘ පාලන ගිණුම (හර) 177
VAT පාලන ගිණුම (බැර) 27
විකුණුම් ගිණුම (බැර) 150 **(2)**

4. ප්‍රාග්ධන ගිණුම (හර) 280
ලද වට්ටම් ගිණුම (හර) 20
වෙ/ගෙ/යුතු දෘ පාලන ගිණුම (බැර) 300 **(2)**

(35) A - (F) B - (F) C - (F) D - (F) **(4)**

(36) A - හිමිකම් **(1)** B - වත්කම් **(1)** C - වගකීම් **(1)** D - හිමිකම් **(1)**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(37) අ) රු. 210 000 (2)
ආ)රු. 200 000 වැඩිවේ. (2)

(38) අ) 1. අමා (රු'000) - 4 100 **(1)** ඉමා (රු'000) - 2 550 **(1)**
ආ) 10 000(රු'000) **(2)**

(39) A - 24 **(1)** B - හිමිකමෙහි **(1)** C - වියදමක් **(1)**, ප්‍රතිපූරණය **(1)**

(40) A - T **(1)** B - F **(1)** C - T **(1)** D - F **(1)**

(41) A - රු. 202 500 **(2)** B - රු. 37 500 **(2)**

(42) A - අදාළ බවින් **(1)**
B - ආර්ථික සම්පතක් **(1)**, භව්‍යතාවයක් **(1)**
C - මධ්‍යස්ථ **(1)**

(43) රු. 900 000 **(4)**

(44) A - F **(1)** B - T **(1)** C - T **(1)** D - F **(1)**

(45) අ. වාර 2.2 **(2)** ආ. රු. 400 000 **(2)**

(46) අ. 2 596 000 **(2)**
ආ. ETF වියදම් ගිණුම හර 66 000
ගෙවිය යුතු ETF ගිණුම හර 66 000 **(2)**

(47) අ. රු. 350 000 **(2)** ආ. රු. 750 000 **(2)**

(48) අ. (රු'000) 5 500 **(2)**
